වාර්ෂික වාර්තාව

Annual Report

2016

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

National Design Centre

අන්තර්ගතය

මග පෙන්වන මූලධර්ම

- දැක්ම
- මෙහෙවර

ආයතනික අරමුණු හා හර වටිනාකම්

ආයතන පනත හා ලියාපදිංචිය

ආයතන කලමනාකාරිත්වය

ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය

සභාපතිගේ පණිවුඩය

අධ්‍යක්ෂගේ පණිවුඩය

ආයතන ව්‍යුහය

මානව සම්පත

මූල්‍ය කාර්ය සාධනය

සංවර්ධන ක්‍රියාකාරකම්

සේවා සැපයීම්

2016 දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වර්ෂයසඳහා වූ අවසාන ගිණුම්

2016 ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව

මග පෙන්වන මූලධර්ම

දැක්ම:-

නිර්මාණ සංවර්ධනය හා
නව නිර්මාණාත්මක මෝස්තර හදුන්වාදීම තුලින්
හස්තකර්මාන්ත ක්ෂේත්‍රය
වඩාත් සක්‍රිය
ආර්ථික ක්ෂේත්‍රයක් බවට පත් කිරීම.

මෙහෙවර:-

ප්‍රවර්ධනය, සංවර්ධනය,
හැකියාවන් ගොඩනැංවීම,
ප්‍රචලිත කිරීම සහ
ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම තුලින්
වෙළඳපොල පාදක කරගත්
නිර්මාණාත්මක මෝස්තර හදුන්වාදීම.

ආයතනික අරමුණු:-

- හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් දැනට නිෂ්පාදනය කරනු ලබන අත්කම් භාණ්ඩ සංවර්ධනය කිරීම සහ දේශීය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපල නැමියාවන්ට අනුව නව නිර්මාණ හදුන්වා දීම.

- නිෂ්පාදන ධාරිතාව වැඩිකර ගැනීම සහ උසස් නිමාවකින් යුතු අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම අරමුණු කරගෙන නිසි තාක්ෂණික ක්‍රම හා අමුද්‍රව්‍ය පිළියෙල කරගැනීමේ ක්‍රම හදුන්වා දීම.

- ආදායම් වැඩිකර ගැනීම තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩාත් යහපත් වර්ධනයක් අරමුණු කරගෙන ශිල්පීන්ට උසස් ශිල්පීය, තාක්ෂණික හා මෝස්තර සංවර්ධන පුහුණු සහාය ලබාදීම.

- හස්ත කර්මාන්ත ශිල්පීන්ට නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම සහ පොදු පහසුකම් සැලසීම සඳහා පොදු පහසුකම් සේවාවන් ලබාදීම.

- හස්තකර්මාන්ත නිර්මාණ සඳහා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හදුන්වාදීම.

- ප්‍රකාශන, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුස්තකාල පහසුකම් සැපයීම මගින් හස්ත කර්මාන්ත ශිල්පීන්ට, අලෙවිකරුවන්ට සහ හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ වී සිටින්නන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම.

- රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් වලට අනුව මෝස්තර උපදේශක සේවාවන් ලබාදීම.

- මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීම සහ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.

හර වටිනාකම්

- ✓ අවංක හා විනිවිදභාවයෙන් යුතු වෙමු
- ✓ නිපුනත්වය හා එකමුතු ප්‍රයත්නයන් විශ්වාස කරමු
- ✓ නව තාක්ෂණය හා අභිරුචිය භාවිතා කිරීමට පෙළඹෙමු
- ✓ හොඳ පාරිභෝගික සේවාවක් ලබා දෙන බවට විශ්වාස කරමු

ආයතන පනත හා ලියාපදිංචිය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද ජාතික මෝස්තර මධ්‍යස්ථානය දේශීය හස්ත කර්මාන්තයේ උන්නතිය උදෙසා හස්තකර්මාන්ත ශිල්පීන් සම්ප්‍රදායෙන් ඔබ්බට ගෙන යමින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය මූලික කරගෙන පිහිටුවනු ලැබූ සේවා සපයන රාජ්‍ය ආයතනයක් වන අතර මේ වන විට සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

සංවිධානය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය,

සමස්ත හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සිය අරමුණු ඉටු කරගැනීමට නිරතුරුව ක්‍රියාත්මක වී සිටී. මෙහිදී මොරටුව, කටුබැද්ද, ද මැල් පාරේ අංක 10 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වයෙන් හා මධ්‍යම පලාත ආවරණය කරමින් මහනුවර, කලාපුරය, නත්තරම්පොත පිහිටුවා ඇති ශාඛා කාර්යාලයේ සහයෝගයෙන් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් හස්තකර්මාන්ත ශිල්පියා නඟා සිටුවීමට කැපවී සිටී.

මීට අමතරව, ඩිප්ලෝමා පාඨමාලා හරහා නව නිර්මාණකරුවන් බිහි කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරන ජාතික පිරිනිර්මාණ විද්‍යාලය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර ඒ හරහා නිර්මාණශීලි හැකියාවක් ඇති තරුණ තරුණියන් ජාතික මට්ටමේ සිටි ජාත්‍යන්තර තලය දක්වා වෘත්තීය දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව ලබාදී ඇත.

එමෙන්ම, නත්තරම්පොත ශාඛා කාර්යාලය තුල ස්ථාපිත පිත්තල, ලාක්ෂා, හා සම් ආශ්‍රිත වැඩහල හා පොදු පහසුකම් මධ්‍යස්ථානය මගින් හස්තකර්මාන්ත ශිල්පියාට අඛණ්ඩ සේවාවක් සපයයි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය සිය දැක්ම ප්‍රධාන කොට ක්‍රියාත්මක මොහෙවර තුලින් තම අරමුණු ඉටු කිරීමේදි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වය ඇතිව හා නත්තරම්පොත පිහිටි ශාඛා කාර්යාලයේ සහයෝගය ඇතිව ක්‍රියාකාරි සැලැස්මට අනුව අදාල කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මඟපෙන්වීමත්, පවතින අනෙකුත් සහෝදර ආයතන මෙන්ම පළාත් සභා හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හි නියැලෙන ස්වෙච්ඡා සංවිධාන, හස්ත කර්මාන්තකරුවෝ සහ වෙනත් බාහිර ආයතන ඉහත දැක්වෙන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා නිරතුරුව සම්බන්ධ වේ.

සියළුම පරිපාලන, මූල්‍ය, අලෙවි ප්‍රවර්ධන කටයුතු, මෝස්තර සංවර්ධන, මෝස්තර අධ්‍යාපන, තාක්ෂණික සංවර්ධන මෙන්ම පර්යේෂණ හා සංවර්ධන යන ක්ෂේත්‍රයට අදාල කාර්යයන් ද පොදු පහසුකම් හා පුස්තකාල සේවා සැපයීම ආදි ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකිරීමට අදාල සියළුම කාර්යයන් ප්‍රධාන කාර්යාලය මගින් සිදුකරන අතර පරිපාලන, මූල්‍ය සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු හැර අනෙකුත් සියළු කටයුතු නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය මගින් ද ඉටු කෙරේ.

(i)	ප්‍රධාන කාර්යාලය	-	අංක 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව.
	දුරකථන/ෆැක්ස් අංක	-	011-2607114 - සභාපති
			011-2626345 - අධ්‍යක්ෂ
			011-2607814 - පොදු
	ෆැක්ස්		011-2607111
	ඊ-මේල්		slndcrisep@yahoo.com / info@slndc.gov.lk
(ii)	නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය සහ වැඩහල	-	කලාපුරය, නත්තරම්පොත.
	දුරකථන අංකය / ෆැක්ස්	-	081-2420038

ආයතනික කළමණාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය

ආචාර්ය කේ. එම්. තවුෆික්	- සභාපති(2016.01.23 දක්වා)
ඒ. එල්. එම්. මිල්හාන් මයා	- සභාපති(2016.04.01 සිට)
එස්. එච්. බී. කරුණාරත්න මයා	- සාමාජික(2016.03.08 සිට)
එම්. එම්. අබ්දුල් කාදර් මයා	- සාමාජික (2016.04.01 සිට)
හේෂානි බෝගොල්ලාගම මෙය	- සාමාජික(2016.01.08 සිට)
ආචාර්ය එස්. එම්. මොහොමඩ් ඉස්මයිල්	- සාමාජික(2016.01.08 සිට)
ඉන්දිරා මල්වත්ත මහත්මිය	- සාමාජික (2016.02.10 සිට)
ඩබ්.ඒ. ඩී. ඩන්ස්ටන් මහත්මිය	- සාමාජික/භාණ්ඩාගාර නියෝජිත
පී. පී. රත්නායක මයා	- උපදේශක (2016.01.05 සිට)

ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

මිල්හාන් ලතීෆ් මයා	- සභාපති
එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි මහතා	- අධ්‍යක්ෂ
ඒ. ඩී. ද සිල්වා මහතා	- නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර) (කොන්ත්‍රාත්)
පේ. ඒ. ඩබ්. ජයමිණි මහත්මිය	- නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (පාලන) කොන්ත්‍රාත් පදනම මත 2016.08.01දක්වා
පේ. ඒ. ඒ. ආර්. සී. ගුණරත්න මහතා	- සහකාර අධ්‍යක්ෂ - පර්යේෂණ (යාන්ත්‍රික) 2016.09.26 දක්වා
ඒ. ඒ. ගාමිණි මහතා	- සහකාර අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු)
පී. කේ. විජේසිංහ මහතා	- සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත)
බී. ආර්. රණවීර මහත්මිය	- ගණකාධිකාරි- ජාතික මෝස්තර මධ්‍යස්ථානය

බැංකුකරුවෝ	**විගණනය**
ලංකා බැංකුව කටුබැද්ද	රජයේ විගණකාධිපති
මහජන බැංකුව කටුබැද්ද	විගණකාධිපති දෙපාර්තමේන්තුව

සභාපතිගේ පණිවිඩය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව හා අනුබද්ධ ආයතන පනතින් ස්ථාපිත 1983 සිට ක්‍රියාත්මක වන ජාතික මෝස්තර මධ්‍යස්ථානය සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවා බිම් මට්ටමේ සිට ජාත්‍යන්තරය දක්වා ඔසවා තැබීමට මාහැගි සේවාවක් කල හැකි ජාතික ආයතනයකි.

දැක්ම හා මෙහෙවර අනුව යමින් 2016 වසරේදි ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද සේවාව ප්‍රශංසනීය වේ.

මෙම 2016 වසර ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වසර 33 ක පැවැත්ම සංකේතවත් කරන අතර, සේවා සපයන ආයතනයක් වන මෙම ආයතනය ක්‍රියාත්මක වන්නේ මහා භාණ්ඩාගාරයෙන් වෙන් කෙරෙන අරමුදල් වලිනි.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය අනෙකුත් සේවා අතර උපදේශන සේවා පැවැත්වීම,අධ්‍යයන පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පාඨමාලා පැවැත්වීම හරහා මධ්‍යස්ථානය උපයාගත් සංචිත ආදායම පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය වී ඇති බව කැපී පෙනෙන කරුණකි.

සමාලෝචිත වර්ෂයේදි ආයතනික ඉලක්කයන් සපුරා ගැනීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් සහයෝගය හා මගපෙන්වීමත්, කළමණාකරනය, කාර්ය මණ්ඩලය ඇතුලු සියලුම පාර්ශ්වකරුවන් විසින් ලබාදුන් සහයෝගය සහ කැපවීමත් මම කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමාගේ නිසි මග පෙන්වීම ඔස්සේ අද වන විට ග්‍රාමීය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය මහත් පිබිදීමකට ලක්ව ඇති බව පැවසීම අතිශයෝක්තියක් නොවේ.

ග්‍රාමීය ආර්ථිකය ඔසවා තැබීමට ඵලදායී ලෙස දායකත්වය ලබාදෙනු පිණිස මෙම මාහැගි කර්තව්‍යයට උරදෙමින් සිටින ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මිල්හාන් ලතිෆ්

සභාපති,
ජාතික මෝස්තර මධ්‍යස්ථානය.

අධ්‍යක්ෂගේ පණිවිඩය

2016 වර්ෂයේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමට සහ වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මා ඉමහත් සතුටට පත්වෙමි. අනෙකුත් වර්ෂ වලට සාපේක්ෂව සලකා බැලීමේදී මූල්‍ය සහ භෞතික ප්‍රගතියේ කැපී පෙනෙන වර්ධනයක් මෙම වර්ෂය තුල දැකගත හැකිය. ආයතනයේ මූලික අරමුණු වලට අනුකූලව සහ ජාතික සංවර්ධන සැලසුම් වලට සමගාමීව විවිධ සංවර්ධන වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට මෙම වර්ෂය තුලදී හැකියාව ලැබී ඇත.

විශේෂයෙන්ම වාසිදායක විගණන මතයක් වසර ගණනාවක සිට ආයතනයට ලැබී තිබීම පිළිබඳව

සතුටට පත්වන අතර ඒ සඳහා ඇප කැප වී කටයුතු කළ ගිණුම් අංශය ඇතුළු අනෙකුත් සියළුම අංශ වල සේවක මහත්ම මහත්මීන්ට විශේෂ ස්තුතියක් පල කරමි.


රට තුල සාමය සහ ආරක්ෂාව තහවුරු කිරීම තුල ඇතිවී තිබෙන හිතකර වාතාවරණය ආර්ථික වර්ධනය උද්දාකර ගැනීම සඳහා මහත් පිටුවහලක් වී තිබෙන බව පැහැදිලි කරුණකි. නිවැරදිව සකස්කර ඇති පිස්කල් හා මූල්‍ය ප්‍රතිපත්ති මෙරට ආර්ථිකය අඛණ්ඩව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය උත්තේජන සපයා දෙන අතර මෙම තත්ත්වය තුල දේශීය සුලු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ අවධානය යොමු කල යුතුවේ.

හස්ත කර්මාන්තකරුවා නංවාලීම හා ඒ තුල ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම සඳහා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය ග්‍රාමීය හස්ත කර්මාන්තකරුවා සංවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

දේශීය අමුද්‍රව්‍ය උපයෝගි කොටගෙන ක්‍රියාත්මක වන ග්‍රාමීය හස්ත කර්මාන්තය නගාසිටුවීම උදෙසා අවශ්‍ය මග පෙන්වීම් සහ නායකත්වය ලබාදීම වෙනුවෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමාටත් එම නියෝජ්‍ය අමාත්‍ය ගරු චම්පික ප්‍රේමදාස මැතිතුමාටත් අමාත්‍යාංශයේ ලේකම් ටී. එම්. කේ. බී.තෙන්නකෝන් මහතාට සහ අප අමාත්‍යාංශයේ සමස්ත කාර්යය මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පළ කරමි.

එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි,
අධ්‍යක්ෂ,
ජාතික මෝස්තර මධ්‍යස්ථානය.

ආයතන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ
HM 1-3
MM 1-1
JM 1-1
MA5-1
MA 3
MA 2-1
MA1-1
PL 3
PL 1
ස.අ/නි.අ (මෝස්තර සංවර්ධන) (අංශ ප්‍රධානි/පළාත්)
ස.අ/නි.අ. (අලෙවි)
ස.අ/නි.අ. (රසායනික)
ස.අ/නි.අ. (නත්තරම්පොත)
ස.අ/නි.අ. (යාන්ත්‍රික)
අභ්‍යන්තර විගණක
ස.අ/නි.අ. (පාලන)
ගණකාධිකාරි
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක
මෝස්තර පුහුණු සම්බන්ධීකරණ නිලධාරි
පරිපාලන නිලධාරි
ගිණුම් නිලධාරි
මෝස්තර සම්පාදක
වැඩසටහන් සම්බන්ධීකාරක
මෝස්තර සම්පාදක
සංවර්ධන සහකාර
අලෙවි සහකාර
සංවර්ධන සහකාර
පුස්තකාල හා තොරතුරු සහකාර
සංවර්ධන සහකාර
පෞද්ගලික සහකාර.
පෞද්ගලික සහකාර.
ශිල්ප උපදේශක
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
ශිල්ප උපදේශක
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
රියැදුරු
රියැදුරු
කාර්යාල සහායක / මුරකරු
කාර්යාල සහායක / මුරකරු

මානව සම්පත්

තනතුරු නාමය	සේවා ගණය	අනුමත	පවතින	පුරප්පාඩු	අධීක්ෂණ නිලධාරි
අධ්‍යක්ෂ	HM 1-3	01	01	-	සභාපති
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන හා පර්යේෂණ	MM 1-1	01	01 (කොන්ත්‍රත්)	-	අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු)	MM 1-1	01	01	-	අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	MM 1-1	01	01 (2016.08.01 දක්වා)		අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන)	MM 1-1	06	-	06	
සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (යාන්ත්‍රික)	MM 1-1	01	01 2016.09.26 දක්වා	-	අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි)	MM 1-1	01	-	01	අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (රසායනික)	MM 1-1	01	-	01	අධ්‍යක්ෂ
ගණකාධිකාරි	MM 1-1	01	01	-	අධ්‍යක්ෂ
පරිපාලන නිළධාරි	JM 1-1	01	01	-	
ගිණුම් නිළධාරි	JM 1-1	01	01	-	
විගණන නිළධාරි	JM 1-1	01	-	01	
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක	JM 1-1	04	05	-	
මෝස්තර පුහුණු සම්බන්ධීකරණ නිලධාරි	JM 1-1	01	-	01	
මෝස්තර සම්පාදක	MA 5-1	09	09	-	
වැඩසටහන් සම්බන්ධීකාරක	MA 5-1	01	-	01	
අලෙවි සහකාර	MA 3	01	-	01	
පුස්තකාල හා තොරතුරු සහකාර	MA 3	01	-	01	
සංවර්ධන සහකාර	MA 3	03	02	01	
පෞද්ගලික සහකාර	MA 2-1	02	02	02	
කළමණාකරණ සහකාර	MA 1-1	13	14	-	
ශිල්ප උපදේශක	MA 1-1	32	19	13	
රියැදුරු	PL 3	06	07	-	

කාර්යාල සහායක	PL 1-1	17	10	07	
මුරකරු	PL 1-1	04	07	-	
පෞද්ගලික වන සේ					
සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත)	JM 1-1	01	01	-	
සහකාර අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු)	JM 1-1	01	01	-	
පුහුණු සහායක	PL - 1	01	01	-	

සංවිධාන ධූරාවලිය



Figure 1

මූල්‍ය කාර්ය සාධනය

මුලික වශයෙන් සේවා සපයන ආයතනයක් ලෙස ක්‍රියා කරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය, රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල යටතට ගැනෙන අතර ඊටඅවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් සපයා ගනු ලබයි.

2016 වසරේ අනුමත අයවැය සහ භාණ්ඩාගාරය වෙතින් ලැබූ ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන පිළිබඳ දත්ත හා තොරතුරු පහත දැක්වේ.

ප්‍රාග්ධන ප්‍රතිපාදන

	2015	2016
ප්‍රාග්ධන වෙන් කිරීම	රු. 15,000,000.00	රු. 18,000,000.00
නිදහස් කිරීම්	රු. 13,442,000.00	රු. 17,870,000.00
පුනරාවර්තන ප්‍රතිපාදන		
	2015	2016
පුනරාවර්තන වෙන් කිරීම	රු. 52,665,000.00	රු. 56,000,000.00
නිදහස් කිරීම්	රු. 51, 466, 000.00	රු. 54,753,000.00

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් ඉටු කරනු ලබන සේවා අතර උපදේශන සේවාව විශේෂ ස්ථානයක් ගනු ලබන අතර උපදේශන සේවා සඳහා අයකරන ගාස්තු, මෙන්ම පිරිනිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා අය කෙරෙන ගාස්තු මඟින් ද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අනුග්‍රහයෙන් සිදුකරනු ලබන නව නිර්මාණ සංවර්ධන හා පුහුණු වැඩසටහන් මෙන්ම ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අරමුදලට එක් වන අතර ඒ අනුව මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන අරමුදල් පහත පරිදි වේ.

1. ජාතික මෝස්තර මධ්‍යස්ථාන අරමුදල (NDC)
2. සේවක ණය අරමුදල (SLF)
3. මෝස්තර උපදේශක සේවා අරමුදල (DCF)
4. මෝස්තර අධ්‍යාපන හා පුහුණු අරමුදල (DET)


16

සංවර්ධන ක්‍රියාකාරකම්-2016

නව නිර්මාණ සැලසුම් කිරීම සහ සංවර්ධන

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, තම අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින්, හස්තකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීමත් ඒවා හස්තකර්මාන්ත ශිල්පීන්ට විවිධ වැඩසටහන් ඔස්සේ හදුන්වාදීමටත් ප්‍රමුඛව කටයුතු කරන අතර, එහි අතරමැදි කාර්යයක් වන සැලසුම් කළ නිර්මාණ අතුරින් තෝරාගත් කොටසක් ජා.මෝ.ම. වැඩහල් තුල මූලික සාම්පල බවට පත් කිරීමට කටයුතු කෙරේ. ඊට අමතරව, සැලසුම් කළ නිර්මාණ වලින් කොටසක් හස්තකර්මාන්ත ශිල්පීන්ගේ ඉල්ලීම මත ඔවුන්ට හදුන්වාදීමට මෝස්තර හා සංවර්ධන අංශය අඛණ්ඩව කටයුතු කර ඇත.

මෙම වර්ෂය තුල නව නිර්මාණ 650ක් සැලසුම් කිරීමට ඉලක්ක කර තිබූ අතර, ප්‍රධාන කාර්යාලයේ මෝස්තර අංශයෙන් හා නත්තරම්පොත ශාඛා කාර්යාලයෙන් නව නිර්මාණ සැලසුම් 922ක් සපුරා ගෙන ඇත. ජා.මෝ.ම. වැඩහල තුල නව නිර්මාණ මූලාදර්ශ බවට පත් කිරීම සඳහා එයින් නව නිර්මාණ 613ක් හදුන්වාදී ඇති අතර, ඉතිරි නව නිර්මාණ 309ක් පිටත ශිල්පීන්ගේ ඉල්ලීම මත සෘජුව ඔවුන්ට හදුන්වාදීමට කටයුතු කර ඇත.



ඊට අමතරව, උපදේශන සේවා යටතේ හා පිටත ආයතන වල ඉල්ලීම මත ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ 50ක් සැලසුම් කිරීමට ඉලක්ක කර තිබූ අතර, රේඛිය අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන්ට හා අනෙකුත් ආයතන වලින් ලද ඉල්ලීම් මත ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ 65ක් නිර්මාණ සැලසුම් කිරීමට මෝස්තර හා සංවර්ධන අංශය කටයුතු කර ඇත.


නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්ථනය කිරීම.

සැලසුම් කළ නව නිර්මාණ සටහන් අතුරින් තෝරාගත් නිර්මාණ, මොරටුව සහ නත්තරම්පොත කාර්යාල පරිශ්‍රය තුල පිහිටි වැඩහල් හරහා මූලාදර්ශ බවට පත් කෙරේ.. මෙහිදී සම්, පිත්තල හා ලාක්ෂා යන අංශ සඳහා සැලසුම් කරන ලද නව නිර්මාණ, නත්තරම්පොත වැඩහල තුලින් මූලාදර්ශ බවට පත් කෙරෙන

අතර, පන් හා කෙඳි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව සහ ආභරණ යන ක්ෂේත්‍ර මූලික කොට කරන ලද නිර්මාණ මොරටුව වැඩහල තුල මූලාදර්ශ බවට පත් කෙරේ.

මෙසේ සකස් කරන ලද මූලාදර්ශ, ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් දිවයින පුරා විවිධ හස්තකර්මාන්ත ක්ෂේත්‍ර යටතේ සංවිධානය කරන නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන්, ජාතික මෝස්තර මධ්‍යස්ථානය වෙත ඉල්ලීම් කරන ලද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හරහා සිදුකරන වැඩසටහන් හා ජාතික මෝස්තර මධ්‍යස්ථානයට සේවා ලබාගැනීම සඳහා පැමිණෙන ශිල්පීන් මඟින්, පළාත්සභා, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හරහා සිදුකරන වැඩසටහන්, නව නිර්මාණ ප්‍රදර්ශන, අලෙවි සල්පිල් මඟින් සහ ශ්‍රී ලංකා හස්තකර්මාන්ත මණ්ඩලය හරහා වෙළඳපලට හදුන්වාදීමට කටයුතු කර කෙරේ. .


ජා.මෝ.ම. වැඩහල් තුල නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්ථනය කිරීම යටතේ 2016 වර්ෂයේ විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ නව නිර්මාණ මූලාදර්ශ 430ක් සකස් කිරීමට ඉලක්ක කල අතර, නව නිර්මාණ මූලාදර්ශ 486ක් වසර තුල සපුරා ගැනීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.



මෙහිදී මොරටුව ජා.මෝ.ම. වැඩහල තුල නව නිර්මාණ 271ක් මූලාදර්ශ බවට පත් කර ඇති අතර, නත්තරම්පොත ජා.මෝ.ම. වැඩහල තුල නව නිර්මාණ 215ක් මූලාදර්ශ බවට පත් කිරීමට කටයුතු කර ඇත.

ඒ අනුව මොරටුව ජා.මෝ.ම. වැඩහල තුල හා නත්තරම්පොත ජා.මෝ.ම. වැඩහල තුල එක් එක් හස්තකර්මාන්ත අංශ යටතේ සකස් කරන ලද නව නිර්මාණයන්හි මූලදර්ශ ප්‍රමාණයන් පහත පරිදි වේ.

නව නිර්මාණ මූලාදර්ශ



හස්තකර්මාන්ත නව නිර්මාණ තුලින් සමරු නිර්මාණ එළිදැක්වීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානය නව නිර්මාණ හරහා දේශීය හස්තකර්මාන්ත, දේශීය මෙන්ම විදේශීය වෙළඳපල තුල ප්‍රචලිත කිරීමට කටයුතු කරයි. එමෙන්ම දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් දේශීය අනන්‍යතාවය රැකෙන පරිදි සමරු නිර්මාණ සංවර්ධනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කරයි.
ඒ අනුව මෙම වර්ෂයේ සමරු නිර්මාණ 30ක් නිර්මාණය කිරීමට ඉලක්ක කර සමරු නිර්මාණ 35ක් සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත.

නව නිර්මාණ සංවර්ධන ප්‍රායෝගික පුහුණු වැඩසටහන්

- **ක්‍රියාකාරී සැලැස්ම යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සංවිධානය කර පවත්වන ලද වැඩසටහන්**

මෙම වර්ෂය සඳහා අනුමත ප්‍රාග්ධන ප්‍රතිපාදන හරහා රු.මි. 2.800 ක් නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද අතර, ඒ හරහා දැනුවත් කිරීම්, මූලික පුහුණු වැඩසටහන්, උසස් පුහුණු වැඩසටහන්, උපදේශාත්මක වැඩසටහන් ඇතුළුව නව නිර්මාණ හදුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 14ක් පැවැත්වීමට හා ප්‍රතිලාභීන් 280 දෙනෙකුට ඒ හරහා පුහුණුව ලබාදීමට ඉලක්ක කරන ලදි. ඒ අනුව නව නිර්මාණ හදුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 17ක් දිවයින පුරා තෝරාගත් ප්‍රදේශ තුල සිදු කරමින් ප්‍රතිලාභීන් 504 දෙනෙකුට නව නිර්මාණ, නව තාක්ෂණික දැනුම ලබා දෙමින් වෙළඳපලට ගැලපෙන නව නිර්මාන හදුන්වා දෙන ලදි.

ක්‍රියාකාරී සැලැස්ම යටතේ සිදුකරන ලද නව නිර්මාණ සංවර්ධන වැඩසටහන්

	වැඩසටහන	ක්ෂේත්‍රය	ස්ථානය	දින ගණන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1.	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි	ත්‍රීකුණාමලය-උප්පුවේලි	03	43
2.	නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන	රෙදිපිළි	මහනුවර	03	72
3.	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි-අත්‍යන්ත්‍ර රෙදි බෑග්	මහනුවර	03	30
4.	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි	අම්පාර	05	34
5.	දැනුවත් කිරීමේ වැඩසටහන	උණ හා වේවැල්	කෑගල්ල-යටියන්තොට	01	14
	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන			03	
	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන			02	
6.	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	වේවැල්	ගම්පහ- මීගමුව	03	18
7.	දැනුවත් කිරීමේ වැඩසටහන	පන් හා කෙඳි	ගාල්ල-බෙන්තොට	01	27
	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන			05	
	නව නිර්මාණ සංවර්ධන උසස් පුහුණු වැඩසටහන			05	
8.	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි	මඩකලපුව-පාලමුනෙයි	05	36
9.	නව නිර්මාණ හා නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන	කොහු	හම්බන්තොට-තංගල්ල	02	05
10.	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	හණ	නුවරඑළිය-හඟුරන්කෙත	05	30
11.	නව නිර්මාණ හා නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන	දැව	කෑගල්ල-පිටිහුම	05	23
12.	නව නිර්මාණ හා නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන	පාවහන්	මහනුවර	03	32
13.	නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන	පිත්තල	ගම්පහ	06	30
14.	දැනුවත් කිරීමේ නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි පැච්වර්ක්	නුවරඑළිය-හඟුරන්කෙත	03	34
15.	නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන	දැව	රත්නපුරය	04	25

16	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	පොල්කටු	ගාල්ල	05	19
17	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රතුමැටි	බදුල්ල	05	32

වැඩසටහන	ක්ෂේත්‍රය	දිස්ත්‍රික්කය/ ගම්මානය/ ස්ථානය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ආරම්භක දිනය හා පැවැත්වූ දින ගණන	ඉල්ලීම කරන ලද ආයතනය
නව තාක්ෂණික වැඩසටහන- සම්පත්දායකත්වය	ෆයිබර් ග්ලාස්	මහනුවර	22	මාර්තු 29 දින 03	මහවැලි අධිකාරිය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
නව නිර්මාණ සංවර්ධන වැඩසටහන	ඇඟලුම්	යාපනය- තෙලිප්පලෙයි	23	අප්‍රේල් 18 දින 05	ස්විස් ලේබර්
මූලික තාක්ෂණික වැඩසටහන-	ෆයිබර් ග්ලාස් සහ රබර්	මුලතිව්- වැලිඔය	14	අප්‍රේල් 08 දින 03	ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
නව නිර්මාණ සංවර්ධන වැඩසටහන	රෙක්සින් බෑග්	යාපනය- තෙලිප්පලෙයි	13	අප්‍රේල් 18 දින 05	ස්විස් ලේබර්
නව නිර්මාණ සංවර්ධන වැඩසටහන	කිරිඳි ඇට	බදුල්ල -දඹාන	32	ජූනි 15 දින 03	කාන්තා සංවර්ධන පදනම
නව නිර්මාණ සංවර්ධන වැඩසටහන- 2 වන අදියර	රතුමැටි	කුරුණෑගල- උදුරගම	15	අගෝස්තු 16 දින 05	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
නව තාක්ෂණික වැඩසටහන	අත්යන්ත්‍ර	මහනුවර	14	අගෝස්තු 02 දින 03	
නව නිර්මාණ සංවර්ධන වැඩසටහන	තලකොළ	කෑගල්ල- මැණික්කඩවර	20	සැප්තැම්බර් 27 දින 03	ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
නව නිර්මාණ සංවර්ධන වැඩසටහන	පොල්කටු	ගාල්ල	16		
නව නිර්මාණ හා නව තාක්ෂණික සංවර්ධන වැඩසටහන	හණ	මාතලේ	28	දින 03	

- **රාජ්‍ය නොවන සංවිධානයන්හි ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද වැඩසටහන්**

රාජ්‍ය නොවන සංවිධානයක් වන යූඑන්ඩීපී ආයතනයේ ඉල්ලීම් හා ප්‍රතිපාදන යටතේ ආරම්භ කරන ලද ව්‍යාපෘති හරහා මන්නාරම, අම්පාර හා පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ යෙදී සිටින්නන්ට හා ක්ෂේත්‍රයට නවක තරුණ කණ්ඩායම් සඳහා වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ හදුන්වාදීම හා නව තාක්ෂණික දැනුම ලබාදීම සඳහා මූලික පුහුණු වැඩසටහන්, උසස් පුහුණු වැඩසටහන් පහත ආකාරයට සිදු කර ඇත. ඊට අමතරව, එම ප්‍රතිලාභීන්ට අවශ්‍ය උපකරණ හා යන්ත්‍ර ලබාදීමට ද අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

	වැඩසටහන	ක්ෂේත්‍රය	කාලය	දිස්ත්‍රික්කය/ගම්මානය/ස්ථානය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	ටේලරින්	මැයි	මන්නාරම-මුරුකන්	21
02	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි	ජනවාරි	අම්පාර	18
03	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	සම්/රෙක්සීන් බෑග්	ජනවාරි	අම්පාර	28
04	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	තල්කොළ	පෙබරවාරි	අම්පාර	28
05	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	කොහු	පෙබරවාරි	අම්පාර- නවිදන්වේලි	23
06	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි	පෙබරවාරි	අම්පාර-දඹාන	32
07	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රතුමැටි	පෙබරවාරි	අම්පාර-උහන	22
08	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	ස්ක්‍රීන් ප්‍රින්ටින්	පෙබරවාරි	අම්පාර - උහන	35
09	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි	මාර්තු	අම්පාර	34
10	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	තල්කොළ	මාර්තු	අම්පාර- ලුණුගල	21
11	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	කොහු	මාර්තු	අම්පාර- විනයගම්පුරම්	22
12	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි	මාර්තු	අම්පාර- දමන- ගල්මඩුව	38
13	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රතුමැටි	මාර්තු	අම්පාර- මාලිගාතැන්න	24
14	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	පොල්කටු	මාර්තු	අම්පාර- නවිදන්වේලි	28
15	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	ස්ක්‍රීන් ප්‍රින්ටින්	මාර්තු	අම්පාර- පොතුවිල්	35
16	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රතුමැටි	මාර්තු	අම්පාර- අක්කරපත්තු	25
17	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	තල්කොළ	අප්‍රේල්	අම්පාර- නවිදන්වේලි	18
18	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි	මැයි	මඩකලපුව -පාලමුනේ	36

19	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිළි	මැයි	මඩකලපුව	33
20	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	පොල්කටු	මැයි	අම්පාර- පොතුවිල්	20
21	නව නිර්මාණ සංවර්ධන උසස් පුහුණු වැඩසටහන	තල්කොළ	ජූනි	මඩකලපුව	30
22	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	වේලරින්	ජූනි	මඩකලපුව	33
23	නව නිර්මාණ සංවර්ධන උසස් පුහුණු වැඩසටහන	රතුමැටි	ජූනි	මඩකලපුව	23
24	නව නිර්මාණ සංවර්ධන උසස් පුහුණු වැඩසටහන	කොහු	ජූනි	මඩකලපුව	25
25	නව නිර්මාණ සංවර්ධන උසස් පුහුණු වැඩසටහන	රතුමැටි	අගෝස්තු	මඩකලපුව	23
26	නව නිර්මාණ සංවර්ධන උසස් පුහුණු වැඩසටහන	රතුමැටි	අගෝස්තු	මඩකලපුව	15
27	නව නිර්මාණ සංවර්ධන උසස් පුහුණු වැඩසටහන	වේවැල්	අගෝස්තු	මඩකලපුව	08
28	නව නිර්මාණ සංවර්ධන උසස් පුහුණු වැඩසටහන	පොල්කටු	අගෝස්තු	මඩකලපුව	17
29	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිලි- සැහැල්ලු සෙල්ලම්	අගෝස්තු	මඩකලපුව- වැලච්චේනයි	27
30	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	විසිතුරු නිර්මාණ	අගෝස්තු	මඩකලපුව	35
31	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	අත්යන්ත්‍ර රෙදිපිලි	සැප්තැම්බර්	මඩකලපුව- ආරියම්පති	09
32	නව නිර්මාණ සංවර්ධන උසස් පුහුණු වැඩසටහන	රතුමැටි	සැප්තැම්බර්	මඩකලපුව- වවුනතිව්	23
33	නව නිර්මාණ සංවර්ධන උසස් පුහුණු වැඩසටහන	රතුමැටි	සැප්තැම්බර්	මඩකලපුව- වාකරේ	17
34	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	රෙදිපිලි	නොවැම්බර්	පුත්තලම	33
35	නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන	පොල්කටු	නොවැම්බර්	පුත්තලම	30

ව්‍යවසායකත්ව ගම්මාන හා කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

උක්ත වැඩසටහන සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් රු.මිලියන 4ක මුදල් ප්‍රතිපාදන ජාතික මෝස්තර මධ්‍යස්ථානය වෙත ලබා දෙන ලද අතර, ඒ හරහා තෝරා ගත් පහත සඳහන් ගම්මාන තුල කාන්තාවන්ට ප්‍රමුඛතාවය දෙමින් නව නිර්මාණ හා නව තාක්ෂණික දැනුම, අවශ්‍ය උපකරණ හා යන්ත්‍ර සූත්‍ර ලබා දීම හා අලෙවි අවස්ථා ලබාදීම වැනි සේවාවන් තුලින් එම ගම්මානයන් තුල සිටින හස්තකර්මාන්ත ශිල්පීන් 151 දෙනෙකු නඟා සිටුවීමට කටයුතු කරන ලදි.

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ගම්මානය	හස්තකර්මාන්ත ක්ෂේත්‍රය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
මොනරාගල	මැදගම	සේනාපතිය	වේවැල්	35
මන්නාරම	මන්නාරම	නදුකුඩා	තල්කොළ	28
ත්‍රිකුණාමලය	මුතූර්	සදිනගර්	රතුමැටි	35
ත්‍රිකුණාමලය	මුතූර්	පෙරියපාලමෙයි	රෙදිපිලි	31
මාතර	දෙවිනුවර	මිදැල්ලමුර	කොහු	22

හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හදුන්වා දීම

හස්තකර්මාන්ත ක්ෂේත්‍රය තුල වෙලඳපලට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වන අතර, එසේ සැලසුම් කරන ලද නව නිර්මාණ විවිධ ආකාරයෙන් හස්තකර්මාන්ත ශිල්පියා වෙත යොමු කරවීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය ක්‍රියා කරයි. ක්‍රියාකාරී සැලැස්ම යටතේ, රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිපාදන යටතේ , රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් යටතේ සිදුකරනු ලබන නව නිර්මාණ හදුන්වාදීමේ පුහුණු වැඩසටහන් හරහා මෙන්ම ආයතනයේ වැඩහල් වෙත පැමිණ පුහුණුවීම් ලබන්නන් හරහා සහ ශිල්පීන්ගේ ඉල්ලීම හා අවශ්‍යතාවය මත ලබා දෙන නව නිර්මාණ සැලසුම් මඟින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හදුන්වාදෙනු ලබයි.

ඒ අනුව ඉහත ආකාරයන්ගෙන් 2016 වර්ෂය තුල ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සැලසුම් කරන ලද නව නිර්මාණ 390ක් හදුන්වාදීමට ඉලක්ක කරමින් නව නිර්මාණ 572ක් සත්‍ය වශයෙන් හදුන්වාදීමට කටයුතු කර ඇත.

හස්තකර්මාන්ත නව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සැලසුම් කරනු ලබන නව නිර්මාණ විවිධ ආකාරයෙන් හස්තකර්මාන්ත ශිල්පීන්ට හදුන්වාදීමට කටයුතු කරන අතරතුර, තෝරා ගත් හස්තකර්මාන්ත ශිල්පීන් හරහා එම නිර්මාණ නිෂ්පාදනය කර වෙළඳපලට හදුන්වාදීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.
එහිදී සැලසුම් කළ නව නිර්මාන වලින් වඩාත් ප්‍රශස්ථ නිර්මාණ සැලසුම් තෝරා ගෙන ඒවා උසස් තත්වයෙන් නිෂ්පාදනය කරනු ලබන හස්තකර්මාන්ත ශිල්පීන් හරහා නිෂ්පාදනය කරවීම මෙම වැඩපිළිවෙලෙහි මූලික කාර්යය වන අතර, එසේ ඔවුන් විසින් නිෂ්පාදනය කරනු ලබන නිර්මාණ ගැණුම්කරුවන්ට හදුන්වාදීම **-යුගයට නිමැවුම්-** 2016 නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය හරහා සිදු කරන ලදි..

මෙම වැඩසටහන සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශ වල සිට හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ යෙදී සිටින හස්තකර්මාන්ත ශිල්පීන් 135 දෙනෙකු සම්බන්ධ කර ගැනිමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කරන ලදි. ඔවුන්ට මෙම වැඩසටහන හරහා
නව නිර්මාණ නිෂ්පාදනයට යොමු වීමට
නව නිර්මාණ නිෂ්පාදනය තුලින් ආර්ථික වර්ධනයක් ඇති කරගැනිමට
නව නිර්මාණ හරහා ලැබෙන ඇනවුම් ඔස්සේ තම වෙළඳපල පුළුල් කර ගැනීමට හැකියාව ලැබුණි.

වෙළඳපල සම්බන්ධතා

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් නිර්මාණය කරන ලද නව නිර්මාන සඳහා ලංකා හස්තකර්මාන්ත මණ්ඩලයෙන් හා අනෙකුත් හස්තකර්මාන්ත අලෙවිසැල් මඟින් ලද ඇනවුම්, සේවාලාභී හස්තකර්මාන්ත ශිල්පීන් හරහා නිෂ්පාදනය කර සැපයීම හා නිෂ්පාදන සංවර්ධන වැඩසටහන ඔස්සේ හස්තකර්මාන්ත ශිල්පීන්ට ඇනවුම් ලබාදීම හරහා හස්තකර්මාන්ත ශිල්පීන් 166 දෙනෙකු වෙළඳපලට සම්බන්ධ කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

අලෙවි පර්යේෂණ වැඩසටහන්

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් නිර්මාණය කරනු ලබන වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ, කොතෙක් වෙළඳපල තුල ප්‍රචලිත වේද යන්න පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා මෙම වර්ෂය තුල අලෙවි පර්යේෂණ වැඩසටහන් 04ක් ඉලක්ක කරන ලදි.

ඒ අනුව ලංකා හස්තකර්මාන්ත මණ්ඩලයේ තුම්මුල්ල අලෙවි මධ්‍යස්ථානය තුල ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව නිර්මාණ ඇතුලත් ප්‍රදර්ශන කවුළුවක් ආරම්භ කිරීමට කටයුතු කළ අතර, මඩකලපුව පැවති ජාත්‍යන්තර වෙලඳ ප්‍රදර්ශනය හරහා සහ ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සංවිධානය කර මහනුවර පවත්වන ලද **-යුගයට නිමැවුම්-** නව නිර්මාණ ප්‍රදර්ශනය හරහා අලෙවි පර්යේෂන වැඩසටහන්

02ක් පැවැත්වීමට කටයුතු කරන ලදි. ඒ හරහා හස්තකර්මාන්ත නව නිර්මාණ කෙරෙහි පාරිභෝගික නැඹුරුව කෙසේ ද යන්න පිලිබඳ අධ්‍යයන කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අලෙවි හා තොරතුරු අංශය විසින් කටයුතු කරන ලදි

යුගයට නිමැවුම්- 2016 නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය 2016 වර්ෂය තුල නිර්මාණය කර හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට හදුන්වාදුන් වෙඳළපලට ගැලපෙන නව නිර්මාණ ප්‍රදර්ශනාත්මකව ඉදිරිපත් කිරීම සඳහා සංවිධානය කළ යුගයට නිමැවුම්- 2016 නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය හා අලෙවි පොළ මෙම වර්ෂයේ දෙසැම්බර් මස 27 දින සිට 30 දින දක්වා මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී පැවැත්වීමට කටයුතු යෙදුණි.

මේ හරහා විවිධ හස්තකර්මාන්ත ක්ෂේත්‍ර ඔස්සේ නව නිර්මාණ 300ක් පමණ එළිදැක්වීමට කටයුතු කරන ලද අතර,හස්තකර්මාන්ත නව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන හරහා හස්තකර්මාන්ත ශිල්පීන් විසින් නිෂ්පාදනය කෙරුණු නව නිර්මාණාත්මක නිෂ්පාදන මෙම ප්‍රදර්ශණයට සමඟාමීව පැවති අලෙවි පොළ හරහා අලෙවි කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානයට හැකියාව ලැබුණි. එම අලෙවි පොළ හරහා රු.මි. 2.1 ක ආදායමක් ලබා ගැනීම තුලින් ඊට සම්බන්ධ වූ හස්තකර්මාන්ත ශිල්පීන්ට එම නිර්මාණ හරහා ඉහල මිලක් ලබා ගැනීමට අවස්ථාව උදෑ කර දෙන ලදි.

ජාතික ශිල්ප සභාව සමඟ සම්බන්ධීකරණය
ශිල්ප 2016 ජාතික ප්‍රදර්ශණය

ජාතික ශිල්ප සභාව විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන උක්ත ප්‍රදර්ශණයේ පූර්ව රාජකාරි යටතේ දිස්ත්‍රික් මට්ටමින් හස්තකර්මාන්ත ශිල්පීන් දැනුවත් කිරීමේ සියළු වැඩසටහන් සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ දායකත්වය ලබාදෙමින් නව නිර්මාණ සම්බන්ධ උපදේශකත්වය ලබාදීමට කටයුතු කෙරුණි.

<u>වෙනත් ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය</u>

ඊට අමතරව පහත සඳහන් ප්‍රදර්ශන සඳහා සහභාගි වෙමින් ප්‍රදර්ශණ පැවැත්වූ කාලය තුල නව නිර්මාණ ප්‍රදර්ශන කුටි පවත්වාගෙන යමින් නරඹන්නන්ට ආයතනය පිළිබඳ හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරන ලදි.

- ජැෆ්නා ඉන්ටර්නැෂනල් ට්‍රේඩ් ෆෙයාර් - ජනවාරි 29 දින සිට සිට 31 දින දක්වා යාපනයේ පවත්වන ලද මෙම ප්‍රදර්ශනයේ නව නිර්මාණ ප්‍රදර්ශනය කරමින් හා අලෙවි කුටියක් පවත්වමින් සහභාගි වන ලදි.

- කලම්බු ෂොපින් ෆෙස්ටිවල් -2016- කොළඹ බණ්ඩාරනායක අණුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී අප්‍රේල් මස 8 වන දින සිට 12වන දින දක්වා පවත්වන ලද මෙම ප්‍රදර්ශනයේ නව නිර්මාණ ප්‍රදර්ශනය කරමින් හා අලෙවි කුටියක් පවත්වමින් සහභාගි වන ලද අතර රු.මි. 0.113 ක නව නිර්මාණ අලෙවි කිරීමට ද හැකියාව ලැණි.

- බිස්නස් ෆෙයාර් -2016 - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද මෙම ප්‍රදර්ශණය මැයි මස 15 දින සිට දින 02ක් පවත්වන ලද අතර, ඒ සඳහා නව නිර්මාණ ප්‍රදර්ශනය කරමින් හා අලෙවි කුටියක් පවත්වමින් සහභාගි වන ලදි.

- යූඩීන්ඩීපී ආයතනය විසින් සංවිධානය කරන ලද මඩකලපුව ජාත්‍යන්තර වෙලඳ ප්‍රදර්ශනය සැප්තැම්බර් මස 30 දින සිට ඔක්තෝම්බර් මස 02 වන දින දක්වා පවත්වන ලද අතර, එහි සියළු ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ අප ආයතනය විසින් සිදු කරන ලදි. එමෙන්ම යූඩීන්ඩීපී ව්‍යාපෘතිය යටතේ අප ආයතනය විසින් පවත්වන ලද නව නිර්මාණ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වී නව නිර්මාණ හා නව තාක්ෂණික දැනුම ලබා ගත් හස්තකර්මාන්ත ශිල්පීන් 100 දෙනෙකුට වෙලඳපල අවස්ථා මේ හරහා ලබාදෙන ලදි.

පුස්තකාල සේවා සහ තොරතුරු සැපයීම

කටුබැද්ද ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ මෙන්ම නත්තරම්පොත ශාඛා කාර්යාලයේ පිහිටි පුස්තකාල සඳහා වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන හරහා මේ වර්ෂය වෙනුවෙන් රු.මි.0.212 ක වටිනාකමින් යුත් නව පොත් මිලදී ගෙන පුස්තකාලයේ පොත් එකතුව වැඩි කර පුස්තකාලය සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදි.
හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විශේෂිත මෙන්ම දුලබ පොත් එකතුවක් සහිත මෙම පුස්තකාලය හරහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලාවන් හදාරන සිසු සිසුවියන්ට මෙන්ම හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල අධ්‍යයන කටයුතු වල යෙදෙන විශ්ව විද්‍යාල සිසුන්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමට විශාල පිටුවහලක් වන අතර, ඊට අමතරව හස්තකර්මාන්ත ශිල්පීන්ට හා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා අවශ්‍ය පුස්තකාල සේවා ලබාදීම, තොරතුරු සැපයීම හා පොත් ආශ්‍රයෙන් අවශ්‍ය නිර්මාණයන්හි ඡායා පිටපත් ලබාදීමේ සේවාවද මේ හරහා සිදුකිරීමට කටයුතු කෙරුණි.

අධ්‍යාපන අංශයේ ක්‍රියාකාරිත්වය
ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය යටතේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය හරහා ජාතික පිරිනිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාව හා ජාතික පිරිනිර්මාණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව හරහා මෙම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන තරුණ තරුණියන්ට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දෙමින් ඔවුන්ව වෘත්තිමය නිර්මාණකරුවන් ලෙස සමාජයට මුදා හැරීමට කටයුතු කරයි.

මෙම පාඨමාලාවන් හැදෑරීම තුලින් ලබා ගන්නා න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම යොදා ගනිමින් ස්වයං ව්‍යාපාර ආරම්භ කිරීමටත්, දේශීය මෙන්ම විදේශීය රැකියා අවස්ථා ලබා ගැනීමටත් අවස්ථාව උදා වේ.

ඉහත පාඨමාලා සති අන්ත පාඨමාලා ලෙස ක්‍රියාත්මක කෙරෙන අතර, මෙම වර්ෂයේ මෙම පාඨමාලා හැදෑරූ සිසු සිසුවියන් සංඛ්‍යාව පහත පරිදි වේ.

ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2016) (සති අන්ත) මෙම පාඨමාලාව සඳහා සිසුන් 12 දෙනෙකු සම්බන්ධ විය

ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2016) (සති අන්ත) මෙම පාඨමාලාව සඳහා සිසුන් 74 දෙනෙකු බඳවා ගත් අතර, මෙම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු 2016 ජනවාරි මස ආරම්භ කරනු ලැබූ අතර, එය 2017 වර්ෂයේ මුල අවසන් කරන ලදි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවා ලබාදීම

2016 වර්ෂය තුල ක්‍රියාකාරී සැලැස්ම යටතේ , වෙනත් ආයතන වල ඉල්ලීම් යටතේ හෝ රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිපාදන යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවාවන් ලබා ගත් ප්‍රතිලාභීන්ට අමතරව, ඇනවුම් හා අලෙවි අවස්ථා ලබාදීම, වෙළඳපල, හස්තකර්මාන්ත ශිල්පීන්, ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබාදීම, ආයතනයේ වැඩහල තුල ප්‍රායෝගික පුහුණුව ලබාදීම, පොදු පහසුකම් ලබාදීම, ආයතනයට පැමිණි/ ඉල්ලීම් මත මෝස්තරවැඩසටහන් වැනි සේවාවන් හරහා සහ හස්තකර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන හා අධ්‍යන කටයුතු සිදුකරන දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල හා පාසල් සිසුන්ට හස්තකර්මාන්ත ක්ෂේත්‍රය මුල් කරගෙන සිදු කරන ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන න්‍යයාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමට හා ආයතනයට කණ්ඩායම් වශයෙන් පැමිණෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා ගුරුවරුන්ට දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් අවශ්‍ය සේවාවන් ලබාදීම වැනි සේවාවන් යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානය 1778 දෙනෙකු සඳහා සේවාවන් ලබා දීමට කටයුතු කර ඇත.

උපදේශක සේවා

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල අවශ්‍යතාවන්ට අනුව උපදේශක සේවාවන් සපයයි. ඒ යටතේ ග්‍රැෆික් නිර්මාණ, ගෘහ අභ්‍යන්තර අලංකරණ කටයුතු, නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන් ආදිය සිදුකරනු ලබයි.

ඒ අනුව, මෙම වසර තුල ජාතික මෝස්තර මධ්‍යස්ථානය, රු.මි. 2.891ක ආදායමක් උපදේශක සේවා හරහා ඉපයීමට කටයුතු සිදුකර ඇත.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය
2016 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්	මූල්‍ය ප්‍රගතිය (%)
ව්‍යාපෘතිය - **වෙළඳපලට ගැලපෙන හා වටිනාකම් එකතුකළ හැකි නව නිර්මාණ සංවර්ධනය**	හස්තකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නව නිර්මාණ සැලසුම් කිරීම	නව නිර්මාණ සංඛ්‍යාව	650	922	130
වෙන් කරන ලද මුදල- **රු.මි. 2.640**	ප්‍රධාන කාර්යාලය හා නත්තරම්පොත මෝස්තර සංවර්ධන අංශය සඳහා කාර්යාල උපකරණ ලබාදීම				

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්	මූල්‍ය ප්‍රගතිය (%)
ව්‍යාපෘතිය - **සැලසුම් කරන ලද නව නිර්මාණ මූලික සාම්පල බවට පත් කිරීම**	වැඩහල් වලට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාදීම	මූලාදර්ශ සංඛ්‍යාව	430	486	81
වෙන් කරන ලද මුදල- **රු.මි. 2.632**	වැඩහල් වලට අවශ්‍ය කාර්යාල උපකරණ, අළුත්වැඩියා, වැඩිදියුණු කිරීම් හා නත්තරම්පොත පොදු පහසුකම් මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම				
	නව නිර්මාණ මූලාදර්ශ බවට පත් කිරීම				

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්	මූල්‍ය ප්‍රගතිය (%)
ව්‍යාපෘතිය - **නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන**	ක්‍රියාකාරී සැලැස්ම යටතේ වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන මත නව නිර්මාණ හා නව තාක්ෂණික ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම	වැඩසටහන් සංඛ්‍යාව	14	17	82
වෙන් කරන ලද මුදල- **රු.මි. 2.975**		ප්‍රතිලාභීන් සංඛ්‍යාව	280	504	
	නව නිර්මාණ ශිල්පීන්ට හදුන්වාදීම	හදුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව	390	572	
	කාර්ය මණ්ඩල පුහුණුව	පුහුණුව ලබාගත් සංඛ්‍යාව	10	32	

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්	මූල්‍ය ප්‍රගතිය (%)
ව්‍යාපෘතිය -**නිෂ්පාදන සංවර්ධන වැඩසටහන**	තෝරාගත් ශිල්පීන්ට නව නිර්මාණ හදුන්වාදීම	සමරු නිර්මාණ සංඛ්‍යාව	30	35	114
වෙන් කරන ලද මුදල- **රු.මි. 2.500**	එම ශිල්පීන් හරහා හදුන්වාදුන් නව නිර්මාණ නිෂ්පාදනය කිරීම	හස්තකර්මාන්ත නව නිර්මාණ සංඛ්‍යාව	50	265	

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්	මූල්‍ය ප්‍රගතිය (%)
ව්‍යාපෘතිය -**අලෙවි පර්යේෂන වැඩසටහන් පැවැත්වීම**	අලෙවි පර්යේෂන වැඩසටහන් සංවිධානය කිරීම	අලෙවි පර්ය්ෂන වැඩසටහන් සංඛ්‍යාව	04	02	--
වෙන් කරන ලද මුදල- **රු.මි. 0.313**	එම ශිල්පීන් හරහා හදුන්වාදුන් නව නිර්මාණ නිෂ්පාදනය කිරීම	වෙළඳපලට හදුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව	120	300	
		වෙළඳපලට හදුන්වාදුන් නව නිර්මාණයන්හි වටිනාකම	රු.මි.5	රු.මි.2.6	
		වෙළඳපලට සම්බන්ධ කළ ශිල්පීන් සංඛ්‍යාව	200	166	

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්	මූල්‍ය ප්‍රගතිය (%)
ව්‍යාපෘතිය- **නව නිර්මාණ ප්‍රදර්ශන**	නව නිර්මාණ ප්‍රදර්ශන සංවිධානය කිරීම	නව නිර්මාණ ප්‍රදර්ශන සංඛ්‍යාව	02	02	103
වෙන් කරන ලද මුදල- **රු.මි. 5.000**	ශිල්ප ජාතික ප්‍රදර්ශණයට සමඟාමීව නව නිර්මාණ ප්‍රදර්ශණ	ප්‍රදර්ශනය කරන ලද නව නිර්මාන සංඛ්‍යාව	330	300	
	වෙනත් ආයතන සංවිධානය කරන ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය	සහභාගී වූ ප්‍රදර්ශන සංඛ්‍යාව	04	04	

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්	මූල්‍ය ප්‍රගතිය (%)
ව්‍යාපෘතිය- **පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම**	අමුද්‍රව්‍ය සඳහා ආදේශන හා නව ක්‍රියාවලීන් සඳහා පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්	පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව	02	01- ක්‍රියාත්මක තත්ත්වයේ පවති,	10
වෙන් කරන ලද මුදල- **රු.මි. 0.400**	අමුද්‍රව්‍ය, ක්‍රියාවලීන්, නිර්මාණ හා වෙළඳපල නැඹියාව යටතේ සංවර්ධනය හා මෙහෙයුම් දත්තයන්				

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්	මූල්‍ය ප්‍රගතිය (%)
ව්‍යාපෘතිය- **පුස්තකාල පහසුකම් හා තොරතුරු**	පුස්තකාල පහසුකම් හා තොරතුරු සැපයීම	පුස්තකාල පහසුකම් සැපයීම- ප්‍රතිලාභීන් සංඛ්‍යාව	200	119	76
වෙන් කරන ලද මුදල- **රු.මි. 0.280**	පුස්තකාලය සඳහා නව පොත් මිලදී ගැනීම				
	ජා.මෝ.ම. වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම	තොරතුරු ලබාදීම හා සහාය කටයුතු	100	117	

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්
ව්‍යාපෘතිය- **රාජ්‍ය නොවන සංවිධානයන්හි ප්‍රතිපාදන යටතේ හා විවිධ ආයතන වල ඉල්ලීම් මත ක්‍රියාත්මක නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන**	රාජ්‍ය නොවන සංවිධානයන්හි ප්‍රතිපාදන හා ඉල්ලීම තෝරාගත් දිස්ත්‍රික්කයන්හි නව නිර්මාණ හා නව තාක්ෂණික ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම	වැඩසටහන් සංඛ්‍යාව	36	45
වෙන් කරන ලද මුදල- **බාහිර ප්‍රතිපාදන**		ප්‍රතිලාභීන් සංඛ්‍යාව	720	994

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්
ව්‍යාපෘතිය- **ගෘහ අභ්‍යන්තර අලංකරණ ජාතික ඩිප්ලෝමා හා උසස් ජාතික ඩිප්ලෝමා**	ගෘහ අභ්‍යන්තර අලංකරණ ජාතික ඩිප්ලෝමා හා උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම	ගෘහ අභ්‍යන්තර අලංකරණ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සිසුන් සංඛ්‍යාව	30	--
වෙන් කරන ලද මුදල- **ඉපයීම් මත**		ගෘහ අභ්‍යන්තර අලංකරණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සිසුන් සංඛ්‍යාව	60	58
		ආදායම රු.මි	4	3.5

ව්‍යාපෘතිය/ වැඩසටහන	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිර්ණායක	නිමවුම් ඉලක්කය	සපුරා ගැනීම්
ව්‍යාපෘතිය- **මෝස්තර උපදේශන සේවා**	රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල ඉල්ලීම මත මෝස්තර උපදේශක සේවාවන් සැපයීම	සැපයූ මෝස්තර උපදේශක සේවා සංඛ්‍යාව	10	02
වෙන් කරන ලද මුදල- **ඉපයීම් මත**		වටිනාකම රු.මි	2	2.891
		ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ සංඛ්‍යාව	50	65



උණ හා වේවැල්



පිත්තල



කොහු



ආභරණ



ලාක්ෂා



ලෙදර්



රතු මැටි



පන් හා කෙඳි



රෙදිපිළි



දැව



උණ හා වේවැල්



පිත්තල



කොහු



ආභරණ



ලාක්ෂා



ලෙදර්



රතු මැටි




පන් හා කෙඳි



රෙදිපිළි



දැව



උණ හා වේවැල්



පිත්තල



කොහු



ආභරණ



ලාක්ෂා




ලෙදර්



රතු මැටි



පන් හා කෙඳි



රෙදිපිළි



දැව

යුගයට නිමැවුම් 2016 - නව නිර්මාණ ප්‍රදර්ශනය - කැන්ඩි සිටි සෙන්ටර්





















යුගයට නිමැවුම් 2016 - නව නිර්මාණ ප්‍රදර්ශනය - කැන්ඩි සිටි සෙන්ටර්
































2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වසර සඳහා අවසාන ගිණුම්

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

(කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය)

අංක 10, ද මැල්පාර,
කටුබැද්ද, මොරටුව

ජාතික මෝස්තර මධ්‍යස්ථානය
2016.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2016.12.31	2015.12.31
		රු	රු
වත්කම්			
ජංගම නොවන වත්කම්	1	57,421,324.98	55,586,518.19
දේපළ පිරියත හා උපකරණ		57,421,324.98	55,586,518.19
ජංගම වත්කම්	2	5,736,721.59	5,069,118.23
අග තොගය	3	3,776,526.91	2,424,973.46
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු	3.1	6,940,209.52	5,814,221.71
කාර්යය මණ්ඩල ණය	4	493,810.49	568,657.65
පෙර ගෙවුම්	5	24,223,242.88	38,447,642.01
මුදල් හා සමාන දෑ		41,170,511.39	52,324,613.06
		98,591,836.37	107,911,131.25
මුළු වත්කම්			
වගකීම්			
ජංගම වගකීම්	6	1,433,249.30	1,388,767.30
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු	7	9,021,332.00	24,539,770.00
UNDP වැඩසටහනට අත්තිකාරම්වශයෙන් ලද මුදල්	8	2,037,338.28	2,660,785.29
උපචිත වියදම්		12,491,919.58	28,589,322.59
ජංගම නොවන වගකීම්	9	26,026,606.50	25,666,386.88
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		38,518,526.08	54,255,709.47
මුළු වගකීම්		**60,073,310.29**	**53,655,421.78**
මුළු ශුද්ධ වත්කම්			
ශුද්ධ වත්කම් /ස්කන්ධය			
විලම්භීත අයභාර ආදායම්		56,976,002.50	57,010,983.24
ප්‍රාග්ධන ප්‍රදාන			
අඩු කළා	10	8,321,948.33	7,307,307.87
ක්‍රමක්ෂය සඳහා වෙන් කිරීම්පවත්නා වර්ෂය			

අඩු කළුවිලම්හීත අයහාර ආදායම් කපා හැරීම		12,262,333.00	10,598,005.87
		36,391,721.17	39,105,669.50
ප්‍රත්‍යාගණන සංචිත		6,578,345.91	2,655,138.71
සමුච්චිත අරමුදල	11	17,103,243.21	11,894,613.57
මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය		**60,073,310.29**	**53,655,421.78**

මූල්‍ය ප්‍රකාශන හා මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණවීම සඳහා අවශ්‍ය ගිණුම්කරන ප්‍රතිපත්ති පිටු අංක 10 සිට 11 දක්වාත් සටහන් පිටු අංක 12 සිට 23 දක්වා දැක්වේ.

සත්‍ය හා සාධාරණ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම වන අතර අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් 2018.8.18 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අත්සන් කරන ලදි.

B.R රණවීර	M.A A.S.K වන්දසිරි	මිල්හාන් ලතීෆ්	M.M. අබ්දුල් කාදර්
ගණකාධිකාරි	අධ්‍යක්ෂ	සභාපති	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
2017.08.14	2017.08.15	2017.08.15	2017.08.18

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යඵල ප්‍රකාශය

	සටහන	2016 රු.	2015 රු.
මෙහෙයුම් ආදායම්			
භාණ්ඩාගාරප්‍රදාන-පුනරාවර්තන	12	54,753,300.00	51,466,000.00
භාණ්ඩාගාරප්‍රදානසංවර්ධන වැඩසටහන්		12,262,333.00	10,598,005.87
ප්‍රදාන කාන්තා ව්‍යවසායකත්ව වැඩසටහන හා ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන		4,427,636.03	-
වෙනත් ආදායම්	13	20,812,676.06	23,087,031.02
		92,255,945.09	85,151,036.89
මෙහෙයුම් වියදම්			
සේවක පඩිනඩි	14	47,941,248.38	46,465,175.68
ගමන් වියදම්	15	561,070.53	281,173.75
සැපයුම් සේවා	16	1,107,527.57	766,609.15
නඩත්තු කටයුතු	17	1,446,443.92	1,275,708.57
ගිවිසුම් ගතසේවා	18	5,596,856.66	4,728,508.30
ක්ෂය වීම්	19	8,321,948.33	7,307,307.87
පාරිතෝෂික		1,476,137.62	5,586,780.74
සංවර්ධනක්‍රියාකාරකම් සඳහා වූ වියදම්	20	8,289,070.03	7,338,400.48
කාන්තා ව්‍යවසායකත්ව වැඩසටහන හා ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන	21	4,476,935.54	-
වෙනත් වියදම්	22	16,152,025.20	16,065,741.99
		95,369,263.78	89,815,406.53
මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය / (ඌණතාවය)		(3,113,318.69)	(4,664,369.64)
<u>එකතු කළා</u>			
විලම්භිත ආදායම්		8,321,948.33	7,307,307.87
		8,321,948.33	7,307,307.87
පවත්නා වර්ෂයේඅතිරික්තය / (ඌණතාවය)		**5,208,629.64**	**2,642,938.23**

2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රග්ධන ප්‍රදාන රු	සමුච්චිත අරමුදල රු	ප්‍රත්‍යාගණන සංචිතය රු	මුලු මුදල රු
2016.01.01 දිනට ශේෂය	39,105,669.50	11,894,613.57	2,655,138.71	53,655,421.78
විලම්භිත අයභාර වියදම් කපා හැරීම	(12,262,333.00)	-	-	(12,262,333.00)
ක්‍රමක්ෂය සඳහා වෙන් කිරීම	(8,321,948.33)	-	-	(8,321,948.33)
ප්‍රත්‍යාගණන සංචිත			3,923,207.20	3,923,207.20
භාණ්ඩාගාර ප්‍රදාන - මුදල්	17,870,333.00	-	-	17,870,333.00
කාලච්ඡේදයේ අතිරික්තය/(ඌණතාවය)	-	5,208,629.64	-	5,208,629.64
2016.12.31 දිනටශේෂය	36,391,721.17	17,103,243.21	6,578,345.91	60,073,310.29

ජාතික මෝස්තර මධ්‍යස්ථානය
2016.12.31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2016		2015	
	රු.	රු.	රු.	රු.
මෙහෙයුම්ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය				
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් අතිරික්ත/ඌණතාවය	(3,113,318.69)		(4,664,369.64)	
එකතු කළා -පෙරවර්ෂය සඳහා ගැලපීම්	-		44,167.92	
අඩු කළා - පෙර වර්ෂය සඳහා ගැලපීම්	-	(3,113,318.69)	(4,262.31)	(4,624,464.03)
මුදල් නොවන වලනයන්				
ක්ෂය වීම්	8,321,948.33		7,307,307.87	
පාරිතෝෂික	1,476,137.62		5,586,780.74	
අවසන් තොග(වැඩිවීම) / අඩුවීම	(667,603.36)		(1,725,533.14)	
අඩු/(වැඩි) වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු	1,351,553.45)		(519,767.18)	
(අඩු) / වැඩි කාර්යය මණ්ඩල ණය	(1,125,987.81)		-	
පෙර ගෙවුම් අඩුවීම්/(වැඩිවීම්)	74,847.16		(237,127.36)	
(අඩු) / වැඩි වෙළඳහා අනෙකුත් ගෙවිය යුතු	44,482.00		435,930.50	
යූ.එන්.ඩී.පී.වැඩසටහන සඳහා ලද මුදල්	(15,518,438.00)		15,971,770.02	
පාරිතෝෂික ගෙවීම්	(1,115,918.00)		-	
(අඩු) / වැඩි උපචිත වියදම්	(623,447.01)	(10,485,532.52)	78,683.11	26,898,044.56
මෙහෙයුම් කටයුතුවලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය		(13,598,851.21)		22,273,580.53
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය				
ගොඩනැගිලි	(1,119,174.20)		(966,427.69)	
යන්ත්‍ර උපකරණ	(936,308.00)		(183,350.00)	
ලී බඩු හා සවිකිරීම්	2,305,498.12)		(563,493.63)	
කාර්යාල උපකරණ	(312,113.30)		(762,474.88)	
උපකරණ හා මෙවලම්	(43,485.00)		(111,910.00)	
පුස්තකාල පොත්	(195,093.30)		(294,709.95)	
පරිගණක හා උපාංග	1,085,076.00)		(1,314,362.00)	
වාහන	(236,800.00)		-	

ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ද මුදල් ප්‍රවාහය		(6,233,547.92)		(4,196,728.15)
මූල්‍යක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය				
ප්‍රාග්ධන ප්‍රදාන -භාණ්ඩාගාරය	5,608,000.00		2,843,994.13	
මූල්‍යක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ද මුදල් ප්‍රවාහය		5,608,000.00		2,843,994.13
මුදල් හා සමාන දැවැඩිවීම / (අඩුවීම)		(14,224,399.13)		20,920,846.51
වර්ෂය ආරම්භයේදී මුදල් හා සමාන දෑ		38,447,642.01		17,526,795.68
වර්ෂය අවසානයේදී මුදල් හා සමාන දෑ		24,223,242.88		38,447,642.01

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

2016 වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති

1 ගිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ගිණුම්වලට බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම යොදා නොමැති අතර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.

2 රජයේ ප්‍රදානයන්

මෙම ආයතනයට ලැබෙන රජයේ ප්‍රදානයන් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වශයෙන් දෙවර්ගයක් වේ.

3 ක්ෂයවීම්

හීනවන ශේෂ ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව ස්ථාවර වත්කම් සඳහා ක්ෂයවීම. සඳහා වෙන්කරනු ලැබ ඇත.

ගොඩනැගිලි	05%
කාර්යාල උපකරණ	10%
පරිගණක හා උපාංග	20%
ලී බඩු සවිකිරීම්	10%
මෙවලම් උපකරණ	25%
මෝටර් වාහන	20%
යන්ත්‍රෝපකරණ	15%
පුස්තකාල පොත්	05%

4 මූල්‍ය කාර්යඵල ප්‍රකාශය

රජයෙන් ලත් ප්‍රදානයන් සහ වෙනත් මිශ්‍ර ලැබීම් ආයතනයේ ආදායම් වශයෙන් දක්වා ඇත. සියළුම අදායම් හා වියදම් උපචිත පදනම මත පිළිගනු ලැබේ.

5 තොග ආගණනය

තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයයන අගයන්ගෙන් අඩුම අගය මත ගණනය කර ඇත. තොග නිකුත් කිරීම පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමයට අනුව සිදුකර ඇත.

6 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සියළුම හදුනාගත් ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා ගැලපීම්කර ඇත.

7 මෝටර් රථ 2016.12.31 දිනට ප්‍රත්‍යාගණනය කොට ඇත

8 ආයතනය සතු ඉඩම් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් ආයතනයේ නමට විධිමත්ව පැවරීමක් නොවීම නිසා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඇති ඉඩම සහ නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලයේ ඉඩම් වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් නොවේ.

9 ආයතනය විසින් 2009 වර්ෂයේදී රු.580,000 වටිනාකම ටෙන්ටර් ගිවිසුමක් මගින් නත්තරම්පොත උද්‍යාන අලංකාර කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් භාර දෙන ලදි. මෙම කොන්ත්‍රාත්කරු විසින් අදාල ගිවිසුමේ කොන්දේසි වලට අනුව නියමිත කාල රාමුව තුල ඉටු කල යුතු වැඩ කටයුතු නිසි ආකාරව ඉටු නොකිරීම නිසා අදාල මුදල් නොගෙවන ලදි. මේ සම්බන්ධයෙන් අදාල කොන්තාත්කරු අදාල මුදල් හා වන්දි මුදල් ඉල්ලා නඩුවක් යොමු කොට ඇත.

ආයතනය විසින් අදාල කොන්ත්‍රාත්කරු ඉටුකල වැඩ සඳහා ගෙවීම් කල යුතු යන්න ආයතනයේ මතය වන අතර එම වටිනාකම රු.502,082.56 වේ. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නැත.

1.දේපල පිරියත හාඋපකරණ

	සටහන	ගොඩනැගිලි	යන්ත්‍රෝපකරණ	මෝටර් වාහන	පරිගණක	කාර්යාල උපකරණ	ලී බඩු සහ සවිකිරීම්	මෙවලම් හා උපකරණ	පුස්තකාල පොත්	එකතුව
		රු	රු	රු	රු	රු	රු	රු	රු	රු
පිරිවැය										
2016.01.01 දිනටශේෂය		21,458,812.30	5,338,676.58	40,288,063.07	10,664,537.84	11,341,858.08	5,700,473.44	898,358.14	2,561,156.44	98,251,935.89
වර්ෂය තුල මිලදීගැනීම්		1,119,174.20	936,308.00	236,800.00	1,085,076.00	312,113.30	2,305,498.12	43,485.00	195,093.30	6,233,547.92
ප්‍රත්‍යාගණනය කළවත්කම් වල පිරිවැය	1.1			(40,514,863.07)						(40,514,863.07)
ප්‍රත්‍යාගණන අගය	1.2			25,600,000.00						25,600,000.00
2016.12.2016 දිනට ශේෂය	*	22,577,986.50	6,274,984.58	25,610,000.00	11,749,613.84	11,653,971.38	8,005,971.56	941,843.14	2,756,249.74	89,570,620.74
ක්ෂය වීම්										
2016.01.01 දිනට ශේෂය		9,235,830.56	2,974,243.50	13,471,259.33	5,476,913.12	7,694,831.37	2,569,336.16	710,306.86	532,696.80	42,665,417.70
වර්ෂයේ ක්ෂය වීම්		612,897.13	366,525.16	5,373,958.08	1,100,381.30	374,663.34	338,136.56	51,694.97	103,691.79	8,321,948.33
ප්‍රත්‍යාගණනය කළවත්කම් වල ක්ෂය	1.3			(18,838,070.27)						(18,838,070.27)
වෙන්කිරීම										
2016.12.31 දිනටශේෂය		9,848,727.69	3,340,768.66	7,147.14	6,577,294.42	8,069,494.71	2,907,472.72	762,001.83	636,388.59	32,149,295.76
පොත් අගය										
2016.01.01 දිනටශේෂය		12,222,981.74	2,364,433.08	26,816,803.74	5,187,624.72	3,647,026.71	3,131,137.28	188,051.28	2,028,459.64	55,586,518.19
2016.12.31 දිනටශේෂය		12,729,258.81	2,934,215.92	25,602,852.86	5,172,319.42	3,584,476.67	5,098,498.84	179,841.31	2,119,861.15	57,421,324.98

සටහන 1.1

වාහන අංකය	පිරිවැය රු
LG 2517 සිංගල් කැබ් රථය	1,188,100.00
253-4929 ඩබල් කැබ් රථය	1,852,874.00
HM 7693 මෝටර් රථය	1,859,589.07
YR 0177 ත්‍රීවීලරය	373,440.00
PE 0011 ඩබල් කැබ් රථය	7,777,320.00
PE2875 ඩබල් කැබ් රථය	8,885,200.00
KX -8260 මෝටර් රථය	8,195,000.00
PH-0069 වෑන් රථය	10,243,500.00
WZ-3555 යතුරු පැදිය	139,840.00
127-0624 යතුරු පැදිය	10,000.00
	40,524,863.07
අඩුකළා ධාවනය නොවන නමුත් භාවිතයෙන් ඉවත් නොකළ යතුරු පැදිය	(10,000.00)
	40,514,863.07

සටහන 1.2

වාහන අංකය	ප්‍රත්‍යාගණනඅගය රු
LG 2517 සිංගල් කැබ් රථය	650,000.00
253-4929 ඩබල් කැබ් රථය	1,600,000.00
HM 7693 මෝටර් රථය	1,700,000.00
YR 0177 ත්‍රීවීලරය	370,000.00
PE 0011 ඩබල් කැබ් රථය	5,800,000.00
PE2875 ඩබල් කැබ් රථය	5,800,000.00
KX -8260 මෝටර් රථය	5,200,000.00
PH-0069 වෑන් රථය	4,400,000.00
WZ-3555 යතුරු පැදිය	80,000.00
127-0624 යතුරු පැදිය	-
	25,600,000.00

සටහන 1.3

2016.01.01 දිනට ශේෂය	
	13,471,259.33
2016 වර්ෂයේ ශේෂය	
	5,373,958.08
127 -0624	
යතුරු පැදියේක්ෂය	(7,147.14)
	18,838,070.27

සටහන02 - අවසාන තොග

	2016.12.31 රු	2015.12.31 රු
අමුද්‍රව්‍ය	526,238.36	224,106.96
නිමි තොග	4,348,606.08	3,850,075.84
ලිපි ද්‍රව්‍ය	839,652.15	972,710.43
මෝස්තර උපදේශක සේවා තොගය	22,225.00	22,225.00
	5,736,721.59	5,069,118.23

සටහන 03 වෙළඳ හා අනෙකුත් ලැබිය යුතුගිණුම්

	2016.12.31 රු	2015.12.31 රු
අත්තිකාරම් ඉන්ධන	200,000.00	200,000.00
අත්තිකාරම් මුදලින්	35,763.22	11,616.22
අත්තිකාරම් වෙක්පත්	40,000.00	4,000.00
අත්තිකාරම් තැන්පතු	4,400.00	-
ලැබිය යුතු මුදල්	246,932.36	63,514.75
තැන්පතු		
දුරකථන තැන්පතු	11,950.00	11,950.00
ඉන්ධන තැන්පතු	10,000.00	10,000.00
පුවත් පත් තැන්පතු	300.00	300.00
සිලින්ඩර් තැන්පතු	6,500.00	6,500.00
වෙනත් තැන්පතු	77,600.00	77,600.00
විදුලි තැන්පතු	20,000.00	20,000.00
මෝස්තර අධ්‍යාපන ගිණුම		
ලැබිය යුතු පංති ගාස්තු	1,144,000.00	694,500.00
අත්තිකාරම්	-	48,696.16
මෝස්තර උපදේශක සේවා ගිණුම		
ශ්‍රී ලංකා හස්තකර්මාන්ත මණ්ඩලය	1,049,560.00	450,520.00
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව		
අත්තිකාරම්	629,521.33	311,056.33
ජාතික ශිල්ප සභාව	-	264,720.00
ගාලු උරුමය පදනම	200,000.00	200,000.00
සුහසාදන සංගමය	100,000.00	50,000.00
	3,776,526.91	2,424,973.46

සටහන 3.1 සේවක ණය

	2016.12.31 රු	2015.12.31 රු
ආපදා ණය	6,925,359.52	5,784,038.35
උත්සව අත්තිකාරම්	14,850.00	24,850.00
බයිසිකල් ණය	-	5,333.36
	6,940,209.52	10,664,168.63

සටහන 04 - පෙර ගෙවුම්

	2016.12.31 රු	2015.12.31 රු
රක්ෂණය	353,439.40	397,984.73
ගිවිසුම්ගත සේවා	19,633.14	64,895.69
බලපත්‍ර ගාස්තු	36,970.69	25,777.23
බදු කුලී භාවරිපණම්	83,767.26	80,000.00
	493,810.49	568,657.65

සටහන 05 - මුදල් හා සමාන දෑ

	2016.12.31 රු	2015.12.31 රු
ජාතිකමෝස්තර මධ්‍යස්ථාන ගිණුම - ප්‍රධාන කාර්යාලය	2,140,216.17	2,279,694.15
ජාතික මෝස්තරමධ්‍යස්ථාන ගිණුම නන්තරම්පොත	16,142.44	84,721.35
මෝස්තර උපදේශක සේවා ගිණුම	16,664,431.87	33,470,235.46
මෝස්තර අධ්‍යාපනගිණුම	4,841,832.32	2,203,680.98
සේවක ණය ගිණුම	560,620.08	409,310.07
	24,223,242.88	38,447,642.01

සටහන06 වෙළඳ හා අනෙකුත් ගෙවියයුතු ගිණුම්

	2016.12.31 රු	2015.12.31 රු
ගෙවියයුතු විගණන ගාස්තු	555,000.00	525,000.00
ආරක්ෂක ඇප තැන්පතු	58,842.50	28,657.50
මෝස්තර අධ්‍යාපනගිණුම		
ලැබිය යුතු පංති ගාස්තු	-	-
මෝස්තර උපදේශකගිණුම		
ආරක්ෂක ඇප තැන්පතු	25,400.00	41,103.00
තල් සංවර්ධන මණ්ඩලය	310,006.80	310,006.80
Oxfam ව්‍යාපෘතියසඳහා ලද අත්තිකාරම්	484,000.00	484,000.00
	1,433,249.30	1,388,767.30

සටහන07 - යූ. එන්. ඩී. පී. ව්‍යාපෘතිය සඳහා ලැබූ අත්තිකාරම් මුදල
(Special Project for Technicial Development and Market Linkage support
for selected weaver producer groups in Nothern Province)

	2016.12.31 රු	2015.12.31 රු
ලැබූ මුදල	24,539,770.00	39,430,869.96
වියදම්	(15,518,438.00)	14,891,099.96
ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සඳහාඉතිරිය	9,021,332.00	24,539,770.00

සටහන 08 - උපචිතවියදම්

	2016.12.31 රු	2015.12.31 රු
ඉන්ධන	8,845.35	24,939.00
දුරකථන	56,415.12	77,962.51
විදුලිය	34,878.94	35,717.59
පුවත් පත්	6,760.00	5,790.00
ගෙවිය යුතු අර්ථසාධක අරමුදල්	393,384.64	403,850.50
ගෙවිය යුතු සේවක භාරකාරඅරමුදල්	98,321.02	100,962.62
ජලය	25,963.67	25,405.18
ශිල්පීය පුහුණු	970.00	-
නව නිර්මාණ ප්‍රදර්ශනය	663,592.56	606,666.06
අතිකාල	89,324.46	104,851.62
ගමන් වියදම්	26,282.50	9,505.75
වැටුප් හා වේතන	276,753.83	290,959.26
මෝස්තර සංවර්ධන	12,896.00	179,516.85
සංග්‍රහ වියදම්	-	6,035.00
ප්‍රවාහන හා කුලී ගාස්තු	30,000.00	27,812.90
වෙනත් දීමනා	25,741.94	26,459.68
ප්‍රවාහන	1,300.00	-
නව නිර්මාණ සංවර්ධනය	5,505.75	-
වෙනත් ප්‍රදර්ශන	-	106,410.81
වාහන නඩත්තු කිරීම	-	

		9,400.00
පිරිසිදු කිරීමේගාස්තු	1,500.00	2,000.00
දැන්වීම්	68,827.50	-
මෝස්තර අධ්‍යාපනගිණුම		
දේශන ගාස්තු	39,075.00	4,930.00
මෝස්තර උපදේශක ගිණුම		
පාස් ඒෂියන් පුද්ගලික සමාගම	-	171,000.00
ලක්දිව එන්ග්‍රේවර්ස්	171,000.00	411,030.00
මෝස්තර සංවර්ධනවැඩසටහන වෙනුවෙන් ගෙවිය යුතු දීමනා	-	29,579.96
	2,037,338.28	2,660,785.29

සටහන.09

2016.12.31 දිනට පාරිතෝෂික වෙන් කිරීම්

	සේවකයාගේ නම	සේවයට බැඳුන දිනය	2016.12.31 දිනට සම්පූර්ණ වසර ගණන	වැටුප		2016.12.31 දිනට පාරිතෝෂික වෙන් කිරීම්
	1		3	4	5	(6) =(3) x (5)
1	ටී අශෝක තිරිමාන්න	26/09/1983	33	38,638.00	19,319.00	637,527.00
2	එස් කේ විමලසිරි	1985-10-06	31	40,948.00	20,474.00	634,694.00
3	යූ එල් වික්‍රමරත්න	1985-10-06	31	40,948.00	20,474.00	634,694.00
4	පී ධර්මසේන	24/06/1985	31	37,684.00	18,842.00	584,102.00
5	එම් හෙට්ටිආරච්චි	27/09/1985	31	48,280.00	24,140.00	748,340.00
6	එම් එස් නාලනී	25/10/1985	31	40,948.00	20,474.00	634,694.00
7	පී විතාන	1985-01-11	31	48,002.00	24,001.00	744,031.00
8	මානෙල් බුලත්ගම	1985-06-12	31	47,630.00	23,815.00	738,265.00
9	ඩී ධර්මසිරි	1986-10-06	27	35,956.00	17,978.00	485,406.00
10	ඩී පී පී හේමචන්ද්‍ර	1986-02-06	30	35,145.00	17,572.50	527,175.00
11	කේ එල් ඒ ප්‍රේමලතා	22/09/1986	30	38,164.00	19,082.00	572,460.00
12	යූ පී පී අමරතුංග	26/10/1986	30	36,526.00	18,263.00	547,890.00
13	ටී එන් කරුණාරත්න	21/11/1986	30	39,040.00	19,520.00	585,600.00
14	එච් එම් ඒ යූ ශාන්ත	1986-08-12	30	44,558.00	22,279.00	668,370.00
15	පී ඩබ් රම්‍යලතා	16/03/1987	29	39,566.00	19,783.00	573,707.00
16	අයි ආර් පියතිලක	17/06/1987	29	39,040.00	19,520.00	566,080.00
17	ඒ ඒ ගාමිණී	1987-01-09	29	56,710.00	28,355.00	822,295.00
18	ඩී පේ පීරිස්	1987-11-11	29	48,756.00	24,378.00	706,962.00
19	එම් ඒ සෝමලතා	1988-01-03	28	54,730.00	27,365.00	766,220.00
20	ඩබ් ඒ පී කේ විජේසිංහ	1988-01-08	28	56,050.00	28,025.00	784,700.00
21	පාලිත පුෂ්පකුමාර	15/04/1988	28	37,108.00	18,554.00	519,512.00
22	ඩබ් ඒ කුලතිලක	1988-01-06	28	36,526.00	18,263.00	511,364.00
23	කේ පී පේ පෙරේරා	14/02/1989	27	36,718.00	18,359.00	495,693.00
24	බී කේ කේ පෙරේරා	28/06/1989	27	36,478.00	18,239.00	492,453.00

25	මානෙල් රාජපක්ෂ	1989-02-10	27	43,962.00	21,981.00	593,487.00
26	යූ එල් ඒ එස් කේ ජයතිස්ස	1990-01-01	26	36,526.00	18,263.00	474,838.00
27	ආර් ඒ පී උදයංගනී	20/02/1990	26	41,870.00	20,935.00	544,310.00
28	කේ කේ එස් ද සිල්වා	15/08/1991	25	42,634.00	21,317.00	532,925.00
29	එම් කේ මහින්ද	1992-01-07	24	39,178.00	19,589.00	470,136.00
30	පී ඒ පි ද සිල්වා	22/03/1993	23	36,496.00	18,248.00	419,704.00
31	එල් ඒ කුලරත්න	1993-05-04	23	36,496.00	18,248.00	419,704.00
32	එච් බී ටි දමයන්ති	1994-03-01	22	51,437.00	25,718.50	565,807.00
33	බී කේ ඒ රුද්‍රිගු	15/06/1994	22	36,160.00	18,080.00	397,760.00
34	ඒ එම් ටි කේ අලගියවන්න	1996-02-05	20	35,478.00	17,739.00	354,780.00
35	බී මනතුංග	1996-03-06	20	53,410.00	26,705.00	534,100.00
36	පේ ඒ ඒ ආර් සී ගුණරත්න	1996-01-07	20	56,254.00	28,127.00	562,540.00
37	ඩී එම් ඒ චන්දිමා	15/07/1996	20	38,122.00	19,061.00	381,220.00
38	එම් ඒ ආර් යූ ගුණරත්න	16/07/1998	18	37,396.00	18,698.00	336,564.00
39	සුසිල් විජේතුංග	1998-01-09	18	34,949.00	17,474.50	314,541.00
40	ඩබ් එම් පියරත්න	1999-04-01	17	46,810.00	23,405.00	397,885.00
41	ආර් එම් විජිත බණ්ඩාර	1999-01-06	17	45,934.00	22,967.00	390,439.00
42	එස් එස් වීරසූරිය	2000-01-02	16	37,054.00	18,527.00	296,432.00
43	එච් ටී දිනේෂ් ද සිල්වා	2000-01-02	16	37,260.00	18,630.00	298,080.00
44	සී කේ කලන්සූරය	2000-01-02	16	37,464.00	18,732.00	299,712.00
45	පී බී පියවතී	2000-01-02	16	35,185.00	17,592.50	281,480.00
46	එන් ඩී එච් මොහොට්ටි	2000-01-02	16	33,799.00	16,899.50	270,392.00
47	කේ රනුර කුමාර	2000-01-02	16	34,547.00	17,273.50	276,376.00
48	ප්‍රශාන්ත කීර්තිචන්ද්‍ර	13/12/2000	16	41,716.00	20,858.00	333,728.00
49	පී සී පේ ද සිල්වා	15/08/2005	11	43,744.00	21,872.00	240,592.00
50	පී සී එන් පෙරේරා	15/08/2005	11	41,140.00	20,570.00	226,270.00
51	වී පී බී ඩි වීරනායක	15/08/2005	11	39,358.00	19,679.00	216,469.00
52	එස් ඩබ් විජිතානි	25/10/2005	11	39,358.00	19,679.00	216,469.00
53	බී ආර් රණවීර	15/02/2006	10	50,962.00	25,481.00	254,810.00
54	ආර් එම් ගාමිණී රත්නායක	2007-12-12	9	33,374.00	16,687.00	150,183.00

55	පේ අනිල් විපේසූරිය	01/01//2008	9	33,374.00	16,687.00	150,183.00
56	අයි ඒ ක්ලීටස් අසංග	15/02/2008	8	35,018.00	17,509.00	140,072.00
57	එම් ටි ටි ජයවර්ධන	15/02/2008	8	34,685.00	17,342.50	138,740.00
58	ටි සී විපේරත්න	2008-03-03	8	41,678.00	20,839.00	166,712.00
59	එම් ඒ ඩි පී කිත්සිරි	15/07/2008	8	34,685.00	17,342.50	138,740.00
60	එම් ටි ආර් ප්‍රනාන්දු	2008-01-09	8	33,374.00	16,687.00	133,496.00
61	එන් පී කේ ඉන්දික	2009-06-08	7	35,511.00	17,755.50	124,288.50
62	ඩබ් එල් එස් එස් රත්නායක	2009-11-04	7	33,236.00	16,618.00	116,326.00
						27,142,524.50
	අඩු කළා පාරිතෝෂිත ගෙවීම්					
1	කේ එල් ඒ ප්‍රේමලතා	22/09/1986	30	38,164.00	19,082.00	553,378.00
2	පේ ඒ ඒ ආර් සී ගුණරත්න	1996-01-07	20	56,254.00	28,127.00	562,540.00
						1,115,918.00
	මුලු පාරිතෝෂිත					26,026,606.50
	ඩි ධර්මසිරි වැටුප් රහිත නිවාඩු වසර 3					

සටහන 10 - ක්‍රමක්ෂය විලම්භීත අයභාර ආදායම්	2016.12.31 රු	2015.12.31 රු
ප්‍රාග්ධන ප්‍රදාන		
පෙර වර්ෂ	39,105,669.50	33,325,483.24
පවත්නා වර්ෂ	17,870,333.00	23,685,500.00
	56,976,002.50	57,010,983.24
අඩු කළා		
ශිල්පීය පුහුණු වියදම්	2,963,000.00	-
සංවර්ධන ක්‍රියාකාරකම්	9,299,333.00	
	12,262,333.00	10,598,005.87
	44,713,669.50	46,412,977.37
අඩු කළා		
ක්‍රමක්ෂය	8,321,948.33	7,307,307.87
	36,391,721.17	39,105,669.50

භාණ්ඩාගාරයේන් ලද ප්‍රාග්ධන ප්‍රදාන ශේෂ පත්‍රයේ විලම්භීත ආදායම් ලෙස දක්වා 2016 වර්ෂයේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය මත ක්‍රමක්ෂය වෙන් කිරීම් කර ඇත

සටහන 11 සමුච්චිත අරමුදල

	2016.12.31 රු	2015.12.31 රු
වර්ෂය මුල ශේෂය	11,894,613.57	9,222,628.69
(+) පෙර වර්ෂ වලගැලපීම්	-	33,308.96
(-) පෙර වර්ෂ වල ගැලපීම්	-	(4,262.31)
	11,894,613.57	9,251,675.34
වර්ෂයේ අතිරික්තය / (ඌනතාවය)	5,208,629.64	2,642,938.23
වර්ෂය අග ශේෂය	17,103,243.21	11,894,613.57

සටහන 12

භාණ්ඩාගාර ප්‍රදාන

	2016.12.31 රු	2015.12.31 රු
ජනවාරි	4,596,000.00	3,000,000.00
පෙබරවාරි	4,590,000.00	4,563,000.00
මාර්තු	4,198,000.00	4,300,000.00
අප්‍රේල්	4,538,000.00	4,330,000.00
මැයි	4,206,000.00	4,315,000.00
ජුනි	4,500,000.00	3,750,000.00
ජූලි	4,572,000.00	4,344,000.00
අගෝස්තු	5,000,000.00	4,500,000.00
සැප්තැම්බර්	5,025,000.00	4,543,000.00
ඔක්තොබර්	4,425,000.00	4,465,000.00
නොවැම්බර්	4,400,000.00	4,428,000.00
දෙසැම්බර්	4,703,300.00	4,928,000.00
	54,753,300.00	51,466,000.00

භාණ්ඩාගාර ප්‍රදාන

	2016.12.31 රු	2015.12.31 රු
භාණ්ඩාගාර ප්‍රදාන -මුදල්	5,608,000.00	13,442,000.00
සංවර්ධන ක්‍රියාකාරකම්	12,262,333.00	-
භාණ්ඩාගාර ප්‍රදාන -වාහන	-	10,243,500.00
	17,870,333.00	23,685,500.00

සටහන13

වෙනත් ආදායම්

	සටහන	2016.12.31 රු	2015.12.31 රු
පුහුණු පාඨමාලා ආදායම්		-	69,694.45
පෞද්ගලික වාහන භාවිතය		9,100.00	5,652.68
වැටුප් රහිතනිවාඩු		28,279.91	40,922.92
ලද රක්ෂණ වන්දි		17,868.35	(35,491.91)
විවිධ ආදායම්		105,218.22	518,863.68
ලාභ අලාභ ගිණුම (අනු අංක 01)		(357,037.03)	464,797.16
රාජ්‍ය භාගය	13.1	1,800.00	-
මෝස්තර අධ්‍යාපන ගිණුම			
මෝස්තර පාඨමාලා ගාස්තු 2014 2015		20,000.00	980,000.00
අයදුම්පත්‍රගාස්තු		-	48,000.00
2016 උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා ගාස්තු		4,071,500.00	498,000.00
සහතික පත්‍ර ප්‍රධානෝත්සව ගාස්තු		-	102,500.00
මෝස්තර උපදේශන සේවා ආදායම්			
මෝස්තර උපදේශන සේවා ආදායම්		-	420,690.00
ලක්සල ව්‍යාපෘතිය		455,510.79	16,573.29
UNDP ආදායම්	13.3	15,518,438.00	14,891,099.96
OXFAMආදායම්		-	4,794,868.00
විවිධ ආදායම්		75,000.00	21,250.00
වෙනත් විකිණුම්		12,800.00	-
පුහුණු පාඨමාලා වලින් ලදඋපදේශක ආදායම්		576,900.00	-
පුහුණු පාඨමාලා වලින් ලදවෙනත් ආදායම්		-	35,651.00
සේවක ණය ගිණුම			
පොළී ආදායම්		277,297.82	213,959.79
		20,812,676.06	23,087,031.02

අනුසටහන 13.1

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

2016-12-31 දිනෙන් අවසන් වසර සඳහා ලාභාලාභ ගිණුම

-

	සටහන	2016.12.31 රු	2015.12.31 රු
ආදායම් (විකුණුම්)		2,523,250.31	2,249,068.94
විකුණූ බඩුවල පිරිවැය (සටහන13-1-1)	13.1.1	2,853,746.34	1,714,284.68
දල ලාභය		(330,496.03)	534,784.26
අඩු කළා -		(41,948.00)	(84,553.60)
එකතු කළා - පොදු පහසුකම් මධ්‍යස්ථානයේ ආදායම්		15,407.00	14,566.50
මූළු ලාභය		(357,037.03)	464,797.16

අනු සටහන13-1-1

	2016.12.31 රු	2015.12.31 රු
<u>අමු ද්‍රව්‍ය</u>		
ආරම්භක තොගය (2016-01-01)	224,106.96	237,630.39
ගැනුම්	888,563.03	618,241.26
	1,112,669.99	855,871.65
<u>අඩු කළා</u>		
අවසන් තොගය (2016-12-31)	526,238.36	224,106.96
පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය	586,431.63	631,764.69
<u>නිමි ද්‍රව්‍ය</u>		
ආරම්භක තොගය(2016-01-01)	3,850,075.84	2,325,480.36
පරිභෝජනය කළ අමු ද්‍රව්‍ය පිරිවැය	4,436,507.47	2,957,245.05
මෝස්තර සංවර්ධන වැඩසටහන් සඳහා මිලදී ගැනීම්	2,807,792.95	2,691,669.07
	7,244,300.42	5,648,914.12
<u>අඩු කළා</u>		
අවසන් තොගය(2016-12-31)	4,390,554.08	3,934,629.44
විකුණූ බඩුවල පිරිවැය	2,853,746.34	1,714,284.68

සටහන14

පෞද්ගලික වැටුප්

	2016.12.31 රු	2015.12.31 රු
වැටුප් හා වේතන	40,707,346.65	39,308,838.93
සේවක අර්ථසාධක අරමුදල්	4,789,775.64	4,680,600.43
සේවක භාරකාර අරමුදල්	1,197,419.03	1,169,696.11
අතිකාල	921,259.97	919,147.37
වෙනත් දීමනා	325,447.09	386,892.84
	47,941,248.38	46,465,175.68

සටහන15

ගමන් වියදම්

	2016.12.31 රු	2015.12.31 රු
දේශීය	301,220.53	281,173.75
විදේශීය	259,850.00	-
	561,070.53	281,173.75

සටහන 16

සැපයුම්

	2016.12.31 රු	2015.12.31 රු
ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	613,037.98	185,651.46
ඉන්ධන	394,060.43	489,957.69
නිල ඇඳුම්	88,000.00	88,000.00
වෛද්‍ය	5,884.16	3,000.00
වෙනත් සැපයුම්	6,545.00	-
	1,107,527.57	766,609.15

සටහන17

නඩත්තු කටයුතු

	2016.12.31 රු	2015.12.31 රු
වාහන නඩත්තු	1,214,935.89	876,289.79
ගොඩනැගිලි නඩත්තු	58,422.00	136,009.50
යන්ත්‍ර හා උපකරණ	16,906.01	28,581.00
කාර්යාල උපකරණ	156,180.02	234,828.28
	1,446,443.92	1,275,708.57

සටහන18

ගිවිසුම්ගත සේවා

	2016.12.31 රු	2015.12.31 රු
ප්‍රවාහන හා කුලී ගාස්තු	696,580.00	640,842.15
දුරකථන ගාස්තු	756,420.93	591,932.55
තැපැල්	39,617.50	31,151.00
විදුලිය හා ජලය	1,019,123.50	982,470.34
බදුකුලී හා වරිපනම්	80,000.00	88,371.68
මීයන් මර්ධනය කිරීම	-	350.00
අලෙවි ප්‍රවර්ධන හා පර්යේෂණ අලෙවි	-	11,075.00
සේවක පුහුණු වැඩසටහන්	-	3,600.00
විගණන ගාස්තු	223,890.00	180,000.00
නීතීඥ ගාස්තු	25,000.00	-
පවිත්‍රතා	136,092.84	129,163.84
ප්‍රචාරනය	68,827.50	-
සුළු මුදල් විවිධ වියදම්	127,775.81	247,237.90
බැංකු ගාස්තු	17,995.00	17,190.00
පුවත් පත්	56,160.00	49,785.00
සේවා ගිවිසුම්	85,405.19	81,334.71
රක්ෂණය	709,069.57	544,941.21
වාහන බලපත්‍ර	66,651.54	70,698.56
වාර්ෂික වාර්තා මුද්‍රණය	150,332.00	139,953.50
සාකච්ඡා හා සංග්‍රහ	336,516.00	323,769.95
ඉන්ධන දීමනා	409,500.00	360,410.40
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා	18,000.00	18,000.00
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	156,700.00	20,000.00
විගණන හා කළමණාකරන කමිටු දීමනා	118,560.95	16,400.00
වෙබ් අඩවි නඩත්තු ගාස්තු	-	13,000.00
භාණ්ඩ සමීක්ෂණවියදම්	298,638.33	166,830.51
	5,596,856.66	4,728,508.30

සටහන 19

ක්ෂයවීම්

	2016.12.31 රු	2015.12.31 රු
ගොඩනැගිලි	612,897.13	620,561.79
යන්ත්‍ර උපකරණ	366,525.16	391,184.08
කාර්යාල උපකරණ	374,663.34	348,745.21
ලී බඩු සවිකිරීම්	338,136.56	267,055.67
මෙවලම්	51,694.97	39,854.90
පුස්තකාල පොත්	103,691.79	94,210.17
පරිගණක	1,100,381.30	1,030,517.05
වාහන	5,373,958.08	4,515,179.00
	8,321,948.33	7,307,307.87

සටහන 20

සංවර්ධනක්‍රියාකාරකම්

	2016.12.31 රු	2015.12.31 රු
දැනුවත් කිරීම්/පුහුණු/ශිල්ප උපදේශකයන් පුහුණු කිරීම්	2,166,331.58	2,935,124.65
කාර්යය මණ්ඩල පුහුණු කිරීම්	178,104.00	-
නව නිර්මාණ සංවර්ධනය	-	-
ආදර්ශ සාම්පල් නිර්මාණය හා සිහිවටන නිර්මාණය	-	-
මෝස්තර සංවර්ධන වැඩසටහන	-	-
ශිල්ප ප්‍රදර්ශනය	552,029.00	-
නව නිර්මාණ ප්‍රදර්ශනය	4,663,838.55	3,936,523.83
වෙනත් ආයතන සමග ප්‍රදර්ශන	728,766.90	-
අලවි ප්‍රවර්ධන	-	-
අමුද්‍රව්‍ය ආශ්‍රිත පර්යේෂණ කටයුතු	-	274,510.00
අලවි ප්‍රවර්ධන හා පරීක්ෂණ අලවි කටයුතු	-	-
වෙබ් අඩවි නිර්මාණය	-	
		192,242.00
	8,289,070.03	7,338,400.48

සටහන 21

ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන හා කාන්තා ව්‍යවසායකත්ව ගම්මානවැඩසටහන

දිස්ත්‍රික්කය	ගම්මානය	අංශය	31.12.2016 රු	31.12.2015 රු
මන්නාරම	නඩුකුඩා	තල් කොළ	728,750.00	-
ත්‍රිකුණාමලය	පෙරියමෙයි	රෙදිපිළි	731,012.00	-
ත්‍රිකුණාමලය	සාදිනගර්	මැටි	974,240.00	-
මොණරාගල	මැදගම	වේවැල්	974,673.00	-
මාතර	මීදෙල්ලමුර	කොහු	669,750.54	-
කෑගල්ල	මොලගොඩ	මැටි	-	-
මන්නාරම	පේතාලෙ	රතුමැටි	398,510.00	-
මන්නාරම	නරවිල්කුලම්	තල් කොළ	-	-
			4,476,935.54	-

සටහන22

වෙනත්වියදම්

	31.12.2016 රු	31.12.2015 රු
මෝස්තර අධ්‍යාපන ගිණුම		
අධ්‍යාපන ක්‍රියාකාරකම්	1,051,493.66	1,349,691.00
වෙනත්	35,196.16	14,911.59
මෝස්තරඋපදේශකගිණුම		
UNDP වැඩසටහන	12,714,957.38	10,191,415.52
OXFAM වැඩසටහන		4,413,344.39
වෙනත්පුහුණුවැඩසටහන්	221,235.70	-
වෙනත්වියදම්	217,228.62	88,479.65
බොල්ණය		6,000.00
විදේශගමන්වියදම්	1,911,913.68	-
ජාතිකමෝස්තරමධ්‍යස්ථානගිණුම		
රසායන ද්‍රව්‍ය	-	-
සේවකණයගිණුම		
බොල්ණය	-	1,899.84
	16,152,025.20	16,065,741.99

C-101

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීසිඑම්/ඒ/එන්ඩිසි/39/2016/එෆ්ඒ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 සැප්තැම්බර් [illegible] දින

NATIONAL DESIGN CENTRE
10 OCT 2017

සභාපති,

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් - 1.ලේකම් - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

2.ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } විසිඑම්/ඒ/එන්ඩිසි/39/2016/එල්ඒ

මබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2017 සැප්තැම්බර් 30 දින

සභාපති,

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනතේ 84(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාපති වෙත වෙත 2017 සැප්තැම්බර් 08 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් ගිණුම් 08 ක එකතු වටිනාකම රු.89,570,620 ක් වුවත්, උපලේඛන අනුව එම වටිනාකම රු.71,126,825 ක් වූයෙන් රු.18,443,795 ක වෙනසක් පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.909,685 ක් වූ අතර, අත්තිකාරම් උපලේඛනය අනුව එම ශේෂය රු.410,577 ක් වූයෙන් රු.499,108 ක වෙනසක් පැවතුණි.

2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.12,729,258 ක් වූ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන කටුබැද්ද පිහිටි ඉඩමේ සහ ව්‍යාපෘති කාර්යාලය පිහිටි නත්තරම්පොත ඉඩමේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට රජයේ ගැසට් නිවේදන හෝ ඉඩම් ඔප්පු විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.3,776,526 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 1 සිට වසර 2 දක්වා වූ ණය ශේෂවල එකතුව රු.911,688 ක්ද වසර 2 සිට වසර 3 දක්වා වූ ණය ශේෂ වල එකතුව රු.266,116 ක්ද වසර 3 හා ඊට වැඩි ණය ශේෂ වල එකතුව රු.234,255 ක්ද වූ අතර, මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.1,433,249 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයෙන් වසර 1 ට අඩු වූ ශේෂ වල එකතුව රු.255,585 ක් සහ වසර 1 සිට වසර 2 දක්වා කාලයට අදාල ශේෂවල එකතුව රු.1,177,664 ක් වූ අතර, මෙම ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) II පරිච්ඡේදයේ 13.4 වගන්තිය	පුරප්පාඩුවී තිබෙන තනතුරකට වැඩබැලීම සඳහා පත් කළ යුත්තේ එම තනතුර දැරීමට සෑම අතින්ම පූර්ණ සුදුසුකම් ලත් නිලධාරියකු වුවද, ඊට පටහැනිව අධ්‍යක්ෂ (අලෙවි/තොරතුරු) තනතුරෙහි වැඩ බැලීම සඳහා 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වැඩබැලීමේ දීමනා ගෙවීමකින් තොරව ආයතනයේ සහකාර ගණකාධිකාරීවරයා පත්කර තිබුණි.
(ii) VII වන පරිච්ඡේදයේ 12.2.6 දරන වගන්තිය	වැඩ බැලීමේ වැටුප් ගෙවීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව තනතුරු 03 ක වැඩ බැලීම වෙනුවෙන් 2016 වර්ෂය තුළ නිලධාරීන් තිදෙනෙකු වෙත එකතුව රු.49,851 ක් ගෙවීම් කර තිබුණි.
(ආ) 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	තන්කාර්ය අත්තිකාරම් එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත්, මෝස්තර උපදේශන ගිණුමෙන් 2016 ජනවාරි සිට ජූනි මාසය දක්වා අවස්ථා 07 කදී ලබාදුන් එකතුව රු.217,565 ක අත්තිකාරම් 2016 දෙසැම්බර් 31 දක්වා පියවීම් කර නොතිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානය විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (United Nation Development Programme) ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රමදායකත්වය සඳහා ලැබූ මුදලින් ඉතිරි වූ මුදල් භාවිතා කර 2016 වර්ෂයේදී සේවකයන් වෙත එකතුව රු.1,245,000 ක් දිරිදීමනා ලෙස ගෙවීම් කර තිබුණි. ඒ සඳහා විධිමත් දිරිදීමනා ගෙවීම් යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබූ අතර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතර කැමැත්ත මත පමණක් ගෙවීම් කර තිබුණි.

(ආ) රාජ්‍ය නොවන සංවිධාන සමඟ කළ වැඩසටහන් මඟින් ආයතනයට ඉතිරි වූ මුදලින් රු.1,000,000 ක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව මෝස්තර උපදේශන ගිණුමෙන්, සේවක ණය ගිණුමට මාරු කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,208,630 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,642,938 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,565,692 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන ප්‍රදාන රු.3,287,300 කින් වර්ධනය වී තිබීමත්, පාරිතෝෂික වියදම රු.4,110,643 කින් අඩුවීමත් ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011, 2012 සහ 2014 වර්ෂවල මූල්‍ය ඌනතාවයක් පැවති අතර 2015 සහ 2016 වර්ෂවල අතිරික්තයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැළපීමේදී මධ්‍යස්ථානයේ දායකත්වය 2012 වර්ෂයේදී රු.27,228,335 ක් වූ අතර, එය ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.61,471,826 ක් වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ 2015 වර්ෂයේ 1.83 ක්ව පැවති ජංගම අනුපාතය, 2016 වර්ෂය වන විට 3.29 දක්වා සියයට 79.78 කින් වර්ධනය වී තිබුණි. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී ජංගම අනුපාතය ඉහළ යෑමට මුළු ජංගම වගකීම් රු.16,097,403 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 07 කට අදාළව වියදම් වල වර්ධනය සියයට 30 සිට සියයට 230 දක්වා පරාසයක විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනත යටතේ පිහිටවූ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ බලතල හා කාර්යයන් එකී පනතේ 82 වන වගන්තිය ප්‍රකාරව පහත දැක්වේ.

- කුඩා කර්මාන්ත සඳහා මෝස්තර සම්පාදනය හා මෝස්තර හා භාණ්ඩ නිෂ්පාදන අමුද්‍රව්‍ය සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම.
- හස්ත කර්මාන්ත භාණ්ඩ සඳහා දේශීය හා විදේශීය වෙළඳපල සංවර්ධනය කිරීම හා කාර්යක්ෂමව හස්ත කර්මාන්ත නිෂ්පාදනය කිරීමට ක්‍රියා කිරීම.
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට හා ශිල්පීන්ට හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය හා සංවර්ධනය සඳහා උපදෙස් දීම හා සහාය වීම.
- අමුද්‍රව්‍ය සඳහා ප්‍රමිති සහතික නිකුත් කිරීම, තොරතුරු බැංකුවක් පවත්වාගෙන යාම හා සපයන සේවා සඳහා ගාස්තු අය කිරීම සහ සමාන ආයතන සමඟ එකඟවීම් වලට එළඹීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිෂ්පාදන ද්‍රව්‍යවල තත්ත්වය හා ප්‍රමිතිය සම්බන්ධයෙන් නියම කරන ලද සහතික නිකුත් කිරීම සහ මෝස්තර, වෙළඳපොල ප්‍රවණතා ගැන තොරතුරු බැංකුවක් පවත්වාගෙන යාම යන කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) මධ්‍යස්ථානයේ බලතල හා කාර්යයන් අතර, හස්ත කර්මාන්ත භාණ්ඩ සඳහා විදේශීය වෙළඳපොල සංවර්ධනය කිරීමේ කාර්යය පැවරී තිබූ අතර, 2016 වර්ෂය තුළ හස්ත කර්මාන්ත භාණ්ඩ සඳහා විදේශීය වෙළඳපොල සංවර්ධනය කිරීම සඳහා පියවරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) අලෙවි පර්යේෂණ වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබුණද වර්ෂය තුළ අලෙවි පර්යේෂණ වැඩසටහන් 02 ක් පමණක් ක්‍රියාත්මක කිරීම නිසා අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 50 ක ප්‍රගතියක් පමණක් ලබා කර ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ අමුද්‍රව්‍ය හා ක්‍රියාවලීන් සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් 02 ක් සහ ගෘහ අභ්‍යන්තර අලංකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව යටතේ සිසුන් 30 දෙනෙකු පුහුණු කර ඩිප්ලෝමා සහතික ලබා දීමට ඉලක්ක කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුළ මෙම ඉලක්ක කිසිවක් ලබා කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) නව සේවාදායකයින් ආකර්ෂණය කර ගැනීම යටතේ සේවාදායකයින් 10 දෙනෙකු ආකර්ෂණය කර ගැනීමට ඉලක්ක කර තිබුණද භෞතික ප්‍රගති වාර්තා අනුව සේවාදායකයින් දෙදෙනෙකු පමණක් ආකර්ෂණය කර ගැනීම නිසා භෞතික ප්‍රගතිය සියයට 20 ක මට්ටමක පැවතුණි.

(iv) ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළ ශිල්පීන්ට හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය හා සංවර්ධනය සඳහා උපදෙස් දීමට උපදෙස් සේවා වැඩසටහන් 10 ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබූ නමුත් භෞතික ප්‍රගති වාර්තා අනුව වැඩසටහන් 02 ක් පමණක් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම නිසා සියයට 20 ක ප්‍රගතියක් පමණක් ලබා කරගෙන තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා දිගින් දිගටම පුහුණු වැඩසටහන් සංඛ්‍යාවේ වැඩිවීමක් සිදු වී තිබුණු අතර, 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 11 කින් එනම් සියයට 13.75 කින්ද, 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 07 කින් එනම් සියයට 10.14 කින්ද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව පහළ බැස තිබුණි.

(ඈ) මධ්‍යස්ථානය පසුගිය වර්ෂ පහ තුළදී දායකත්වය ලබාදුන් ප්‍රදර්ශන සංඛ්‍යාව 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඩු වැඩි වෙමින් පැවති අතර, 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී සියයට 12.5 කින් අඩු වී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී "යුගයට නිමවුම්" ප්‍රදර්ශනයේ භාණ්ඩ අලෙවිය මඟින් එකතුව රු.2,100,595 ක ආදායම් උපයාගෙන තිබූ නමුත් ඒ වෙනුවෙන් දරන ලද මුළු වියදම රු.4,657,790 ක් වීමෙන් ආදායම ඉක්මවූ වියදම රු.2,557,195 ක් විය.

(ආ) හස්ත කර්මාන්ත මණ්ඩලයෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.450,520 ක් වූ ලැබිය යුතු ණය ශේෂය 2016 දෙසැම්බර් 31 දිනට රු.1,049,560 ක් දක්වා රු.599,040 කින් ඉහළ ගොස් තිබූ අතර, එම ණය අයකර ගැනීමට කළමනාකරණය පියවර ගෙන නොතිබුණි.

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (United Nation Development Programme) මඟින් ලැබූ මුදලින් රු.9,021,332 ක් 2015 සැප්තැම්බර් මස 28 දින සිට ඵලදායී කාර්යයකට භාවිතා නොකර රජයේ බැංකු ජංගම ගිණුමක නිෂ්කාර්යව පැවතුනි.

(ඈ) මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව එකතුව රු.94,506 ක තොග ඌනතාවයක් සහ එකතුව රු.25,576 ක තොග අතිරික්තයක් පැවතුණි. සමීක්ෂණ වාර්තා අනුව හඳුනාගත් මෙම තොග අතිරික්තය තොගයට ගැනීමටත්, තොග ඌනතාවය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමටත්, පියවරගෙන නොතිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.909,685 ක් වූ නොපියවූ විවිධ අත්තිකාරම් හඳුනාගෙන පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පංති ගාස්තුව එකතුව රු.1,144,000 ක් විය. මෙම ලැබිය යුතු පංති ගාස්තු ශේෂය තුළ 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලැබිය යුතු පංති ගාස්තු එකතුව රු.441,000 ක් වූ අතර, 2016 වර්ෂයේ ලැබිය යුතු පංති ගාස්තු රු.703,000 ක් විය. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී ලැබිය යුතු පංති ගාස්තු සියයට 64.7 කින් ඉහළ ගොස් තිබුණ ද ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩලය 109 දෙනෙකු හා තත්‍ය කාර්ය මණ්ඩලය 83 ක් වීමෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ඇතුළුව සමස්ථ කාර්ය මණ්ඩලයේ 26 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. මෙම කාර්ය මණ්ඩල ඌනතාවය නිසා පරිපාලනමය ගැටළු අභ්‍යන්තර පාලනය, වැඩ බෙදීම, අභ්‍යන්තර පරීක්ෂාව හා අභ්‍යන්තර විගණනය යන කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමේ ප්‍රමාදයන් පැවතුණි.

4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රතු මැටි නිෂ්පාදන ශිල්පීන් වෙත ලබාදීම සඳහා විදුලි සකපෝරු යන්ත්‍ර 23 ක් මිලදී ගැනීමට 2016 වර්ෂය තුළ එකතුව රු.1,196,000 ක් ගෙවීම් කර තිබුණි. මෙම ගෙවීම් සිදු කිරීමට ප්‍රථම 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) වගන්තිය ප්‍රකාරව ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 වගන්තිය ප්‍රකාරව වාහන තක්සේරු කිරීමේ කාර්යය සඳහා ආයතන කිහිපයකින් මිල ගණන් කැඳවීමකින් තොරව ප්‍රසම්පාදන කාර්යය සිදු කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණනය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මධ්‍යස්ථානයේ 2016 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මාස 03 ක ප්‍රමාදයකින් පසු 2017 ජූනි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(අ) වගන්තිය ප්‍රකාරව, ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

ආයතනයේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා වැඩ ආවරණය කිරීමේ පදනම මත එක් නිලධාරිනියක් පත්කර තිබූ අතර, එම තනතුර සඳහා ස්ථීර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ වැය විෂයයන් 04 ක අයවැයගත සහ සත්‍ය වියදම් අතර, සියයට 12 සිට සියයට 24 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ආ) මෝස්තර උපදේශක ගිණුමෙහි වැය විෂයයන් 04 ක එකතු වටිනාකම රු.15,065,335 ක් සහ මෝස්තර අධ්‍යාපන ගිණුමෙහි වැය විෂයයන් 02 ක එකතු වටිනාකම රු.1,086,690 ක ගෙවීම් පිළිබඳව අයවැය ලේඛනයේ ප්‍රතිපාදනයන් සලසා නොතිබුණි.

5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණිත ගිණුම් සමඟ වාර්ෂික වාර්තා භාෂාත්‍රයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2014 සහ 2015 වර්ෂ වල වාර්ෂික වාර්තා 2017 ජූලි දක්වාම සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මධ්‍යස්ථානයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) මූල්‍ය පාලනය	ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් නොකිරීම, බැංකු සැසඳුම් සකස් කිරීමේදී නිරවුල් නොකළ ශේෂ පැවතීම.
(ආ) ගිණුම්කරණය	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ජර්නල් වවුචර් සකස් කිරීමකින් තොරව ජර්නල් සටහන් 772 ක් ඇතුලත් කර තිබීම.
(ඇ) ස්ථාවර වත්කම් පාලනය	වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු නොකිරීම, සම්ක්ෂණ මණ්ඩල පත් කිරීම ප්‍රමාද කිරීම හා සම්ක්ෂණ ප්‍රමාද කර සිදු කිරීම.
(ඈ) අභ්‍යන්තර විගණනය	අභ්‍යන්තර පාලන ක්‍රම හා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් නොකිරීම, අභ්‍යන්තර විගණනය කාර්යක්ෂමව ක්‍රියාත්මක නොකිරීම.
(ඉ) කාර්ය මණ්ඩල කළමනාකරණය	ස්ථීර තනතුරු සඳහා දීර්ඝ කාලයක සිට කොන්ත්‍රාත් සේවකයන් සේවයේ යෙදවීම, ස්ථීර තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම ප්‍රමාද කිරීම.
(ඊ) පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම	ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති